# කාර්යසාධන වාර්තාව
# 2018

## ග්‍රාමීය ආර්ථික කටයුතු හා පශු සම්පත් සංවර්ධන අංශය


නො. 492, ආර්.ඒ.ද මෙල් මාවත,
කොළඹ 03.

දුරකථන : 011-2556724
ෆැක්ස්: 011-2556486
විද්‍යුත් තැපෑල:info@reco.gov.lk
වෙබ් අඩවිය: www.reco.gov.lk

## අන්තර්ගතය පිටු අංකය


**01.ග්‍රාමීය ආර්ථික කටයුතු හා පශු සම්පත් සංවර්ධන අංශය**

| | | |
|---|---|---|
| 1.1. | දැක්ම | 1 |
| 1.2. | මෙහෙවර | 1 |
| 1.3. | අංශයේ අරමුණු | 1 |
| 1.4. | අංශයේ කාර්යභාරය | 2 |
| 1.5. | අංශය යටතේ ඇති ආයතන ව්‍යුහය | 3 |

**02. සංවිධාන ව්‍යුහය** 4

**03. මානව සම්පත් කළමනාකරණය**

| | | |
|---|---|---|
| 3.1. | කාර්ය මණ්ඩල සංයුතිය | 5 |
| 3.2. | ස්ථාන මාරු, ආයතනික කටයුතු | 7 |
| 3.3. | මානව සම්පත් සංවර්ධනය | 7 |
| 3.4. | ණය ලබා දීම | 7 |

**04. වාහන** 8

**05. නීති කටයුතු** 9

**06. මූල්‍ය කළමනාකරණය**

| | | |
|---|---|---|
| 6.1. | පුනරාවර්තන හා මූලධන වියදම් | 10 |
| 6.2. | විගණන විමසුම් පිළිබඳ තොරතුරු | 14 |

**07. අභ්‍යන්තර විගණන අංශය** 14

**08. කාර්යසාධන ප්‍රගතිය** 15

**09. පශු සම්පත් සංවර්ධන අංශය**

| | | |
|---|---|---|
| 9.1 | 2018 වර්ෂය තුළදී පශු සම්පත් සංවර්ධන අංශය මඟින් ක්‍රියාත්මක කරන ලද සංවර්ධන වැඩසටහන් හා ව්‍යාපෘතීන්ගේ ප්‍රගතිය | 17 |
| 9.2 | දියර කිරි පරිභෝජනය ප්‍රවර්ධනය හා ප්‍රචලිත කිරීමේ වැඩසටහන | 18 |
| 9.3 | අභිජනන ගොවිපොළවල් ස්ථාපනය කිරීම | 18 |
| 9.4 | පශු සම්පත් සංවර්ධන මධ්‍යකාලීන වැඩසටහන | 20 |
| 9.5 | සුළු හා මධ්‍ය පරිමාණ කුකුළු ගොවිපොළ සංවර්ධන වැඩසටහන | 20 |
| 9.6 | ශ්‍රී ලංකාවේ සූකර කර්මාන්තය සංවර්ධන වැඩසටහන | 21 |
| 9.7 | බඩල්ගම නව කිරි සැකසුම් මධ්‍යස්ථානයක් ස්ථාපනය කිරීම | 21 |
| 9.8 | ආහාර නිෂ්පාදන ජාතික වැඩසටහන | 21 |
| 9.9 | කිරි ගවයින් ආනයනය කිරීම | 22 |

9.10 කුඩා පරිමාණ කිරි නිෂ්පාදකයින්ගේ සමුපකාර සමිති සංවර්ධනය කිරීම 23

## 10. සංවර්ධන හා සැලසුම් අංශය මගින් සමාලෝචිත වර්ෂයේදී ඉටු කරන ලද කාර්යභාරය

10.1 ග්‍රාමීය ආර්ථික සංවර්ධන ව්‍යාපෘති 24
10.2 ග්‍රාමීය යටිතල පහසුකම් හා ජීවනෝපාය සංවර්ධන වැඩසටහන - 2018 28
10.3 විශේෂිත ආර්ථික මධ්‍යස්ථාන 28

# 01. ග්‍රාමීය ආර්ථික කටයුතු හා පශු සම්පත් සංවර්ධන අංශය

## 1.1. දැක්ම

තිරසාර ගැමි ආර්ථිකයක් තුළින් ඉසුරුමත් දැයක්

## 1.2. මෙහෙවර

ග්‍රාමීය ජනතාවගේ ආර්ථික මට්ටම ඉහළ නැංවීම උදෙසා ජීවනෝපාය සංවර්ධනය, දේශීය ඉල්ලුමට සරිලන පරිදි ඉහළ ගුණාත්වයකින් යුත් පශු සම්පත් නිෂ්පාදන වර්ධනය සහ දේශීය හා අන්තර්ජාතික වෙළෙඳපොළ තුළ තරගකාරීත්වයට සාර්ථකව මුහුණ දියහැකි අයුරින් සමෘද්ධිමත් දේශීය නිෂ්පාදකයින් බිහි කිරීම.

## 1.3. අංශයේ අරමුණු

- ❖ ග්‍රාමීය ජනතාව ආර්ථිකව නගා සිටුවීම සඳහා ග්‍රාමීය ජීවනෝපාය සංවර්ධන ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය මූලාධාර සම්පාදනය සහ ග්‍රාමීය යටිතල පහසුකම් හා කුඩා ව්‍යවසාය සංවර්ධනය ප්‍රවර්ධනය කිරීම.

- ❖ පශු සම්පත් ක්ෂේත්‍රයේ සංවර්ධනය උදෙසා ඉහළ නිෂ්පාදන ඵලදායීතාවයකින් සමන්විත සත්ත්ව ගහනයක් ඇතිකරලීම සහ ආහාරයන්හි සෞඛ්‍යාරක්ෂිතභාවය තහවුරු කිරීම සඳහා අවශ්‍ය තාක්ෂණික මගපෙන්වීම හා සහය ලබා දීම.

- ❖ නිරෝගිමත් සත්ත්ව ගහනයක් ඇතිකරලීම සඳහා ගුණාත්මක සත්ත්ව ආහාර ප්‍රචලිත කිරීම සහ සත්ත්ව රෝග වළක්වාලන හා මර්දනය කරන කාර්යක්ෂම සත්ත්ව සෞඛ්‍ය සේවාවක් සහතික කිරීම.

- ❖ පශු සම්පත් මඟින් ඉහළ නිෂ්පාදන ධාරිතාවයක් ලබා ගැනීම සඳහා ඉහළ ගුණාත්වයකින් යුත් සත්ත්ව ජාන සම්පත් ප්‍රශස්ත මට්ටමින් ප්‍රයෝජනයට ගැනීම ප්‍රචලිත කිරීම සහ දේශීය සත්ත්ව ප්‍රභේදයන් වැඩිදියුණු කිරීම.

- ❖ පශු සම්පත් නිෂ්පාදන අලෙවිකරණය, සැකසීම සහ අගය එකතු කිරීම වැඩි දියුණු කිරීම සඳහා විධිමත් අලෙවි ජාලයන් ඇති කිරීම සඳහා අදාළ පාර්ශවයන් දිරි ගැන්වීම.

- ❖ දේශීය කිරි ගොවීන් ශක්තිමත් කරමින් දියර කිරි නිෂ්පාදනයේ ඉලක්කගත වර්ධනය සාක්ෂාත් කර ගැනීමට දිරි දීම.

- ❖ පූර්ණ බලැති ජාතික කෘෂිකර්ම අලෙවිකරණ අධිකාරිය ස්ථාපිත කිරීම තුළින් ප්‍රාදේශීය හා ගම් මට්ටමින් කෘෂි නිෂ්පාදන මිලට ගැනීම හා ගබඩා කිරීම සහ කෘෂිකාර්මික නිෂ්පාදන අලෙවිකරණය සම්බන්ධීකරණය කිරීම.

- ❖ තොග වෙළෙඳුන් හා පාරිභෝගිකයින්, කෘෂි නිෂ්පාදකයින් සමඟ සම්බන්ධ කිරීම තුළින් දේශීය කෘෂි නිෂ්පාදන මිල තිරසාර මට්ටමක පවත්වා ගැනීමේ අරමුණින් විශේෂිත ආර්ථික මධ්‍යස්ථාන පිහිටුවීම.

## 1.4. අංශයේ කාර්යභාරය

නව අමාත්‍යාංශ සංශෝධනයත් සමඟ දැනට මෙම අමාත්‍යාංශය කෘෂිකර්ම,ග්‍රාමීය ආර්ථික කටයුතු, පශු සම්පත් සංවර්ධන, වාරිමාර්ග සහ ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යාංශය ලෙස ස්ථාපිතව පවතී. දැනට ග්‍රාමීය ආර්ථික කටයුතු හා පශු සම්පත් සංවර්ධන අංශය ලෙස ක්‍රියාත්මකව පවතින මෙම අංශය 2018 දෙසැම්බර් මස 20 දක්වා ඊට පූර්වගාමීව පැවති ධීවර හා ජලජ සම්පත් සංවර්ධන සහ ග්‍රාමීය ආර්ථිකය පිළිබඳ අමාත්‍යාංශය යටතේ ග්‍රාමීය ආර්ථික අංශය ලෙස ක්‍රියාත්මක විය. එයටද පූර්වගාමීව පැවති ග්‍රාමීය ආර්ථිකය පිළිබඳ අමාත්‍යාංශයට පවරා තිබූ කාර්යයන් හා කර්තව්‍යයන් තවදුරටත් මෙම අංශයේ කාර්යයභාරය වන අතර, ඒ අනුව මෙම අංශය මඟින් ක්‍රියාත්මක වන කාර්යයන් හා කර්තව්‍යයන් පහත පරිදි වේ.

- ❖ ග්‍රාමීය ආර්ථිකය පිළිබඳ විෂයයට සහ අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වන දෙපාර්තමේන්තුව හා ව්‍යවස්ථාපිත ආයතනයන්හි විෂයයන්ට අදාළ ප්‍රතිපත්ති, වැඩසටහන් සහ ව්‍යාපෘති සම්පාදනය කිරීම, පසු විපරම් කිරීම හා ඇගයීම.
- ❖ ග්‍රාමීය ජීවනෝපාය සංවර්ධන ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම.
- ❖ ප්‍රාදේශීය සහ ග්‍රාමීය සංවර්ධන ප්‍රතිපත්ති සහ උපායමාර්ගික සංවර්ධනය.
- ❖ ග්‍රාමීය යටිතල පහසුකම් සහ කුඩා ව්‍යවසාය සංවර්ධන කටයුතු.
- ❖ ග්‍රාමීය ආර්ථික කටයුතු සඳහා මූල්‍යාධාර සම්පාදනය.
- ❖ පශු සම්පත් අංශයේ නිෂ්පාදනය ඉහළ නැංවීම සඳහා අවශ්‍ය වන පහසුකම් සැපයීම.
- ❖ සත්ත්ව සුභසාධනය හා ඒ සම්බන්ධ කටයුතු.
- ❖ පශු සම්පත් ආශ්‍රිත නිෂ්පාදන ප්‍රවර්ධනය, ප්‍රචාරණය හා සංවර්ධනය සඳහා අවශ්‍ය පියවර ගැනීම.

- ❖ නවීන තාක්ෂණය යොදා ගනිමින් පශු සම්පත් සම්බන්ධ පර්යේෂණ අංශය පුළුල් කිරීම හා එහි ප්‍රතිඵල මත නිපැයුම් ක්ෂේත්‍රය ගුණාත්මකව හා ප්‍රමාණාත්මකව වර්ධනය සඳහා අවශ්‍ය පියවර ගැනීම.

- ❖ පශු ක්ෂේත්‍රයේ සත්ත්ව ගහනය වැඩිදියුණු කිරීම සඳහා විද්‍යාත්මක බෝ කිරීමේ ක්‍රම ප්‍රචලිත කිරීම සහ එම සතුන් රෝගවලින් ආරක්ෂා කිරීම හා නිරෝධායන කටයුතු.

මෙම අංශය වෙත පවරා ඇති මෙම කාර්යයන් ප්‍රධාන ක්ෂේත්‍ර 4 ක් යටතේ ක්‍රියාත්මක වේ.


- ❖ ග්‍රාමීය ජනතාව ආර්ථිකව නගා සිටුවීම සඳහා ග්‍රාමීය ජීවනෝපාය සංවර්ධනය කිරීම.
- ❖ ඉහළ ගුණත්වයකින් යුත් පශු සම්පත් නිෂ්පාදන වර්ධනය කිරීම තුළින් දේශීය ඉල්ලුම සපුරාලීම.
- ❖ පශු සම්පත් නිෂ්පාදන අලෙවිකරණය, සැකසීම සහ අගය එකතු කිරීම වැඩි දියුණු කිරීම සඳහා විධිමත් අලෙවි ජාලයන් ඇති කරලීම තුළින් වෙළෙඳපොළ විධිමත් කිරීම.
- ❖ කෘෂි නිෂ්පාදන මිලට ගැනීම, ගබඩා කිරීම සහ කෘෂිකාර්මික නිෂ්පාදන අලෙවිකරණය සම්බන්ධීකරණය කිරීම තුළින් දේශීය හා අන්තර්ජාතික වෙළෙඳපොළ තුළ තරගකාරීත්වයට සාර්ථකව මුහුණ දියහැකි දේශීය නිෂ්පාදකයින් බිහිකිරීම.

## 1.5 මෙම අංශය යටතේ ඇති ආයතන ව්‍යුහය

මෙම අංශය වෙත පවරා ඇති කාර්යයන් මැනවින් ඉටුකරලීම පිණිස මෙම අංශය යටතේ ක්‍රියාත්මක වන ආයතනයන් පහත පරිදි වේ.

1. සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව
2. ජාතික පශු සම්පත් සංවර්ධන මණ්ඩලය
3. සී/ස මිල්කෝ (පුද්ගලික) සමාගම
4. සී/ස මහවැලි සත්ත්ව ව්‍යාපාරික සමාගම
5. සී/ස ශ්‍රී ලංකා කුකුළු පාලන සංවර්ධන (පුද්ගලික) සමාගම
6. විශේෂිත ආර්ථික මධ්‍යස්ථාන

## 02. සංවිධාන ව්‍යුහය


ලේකම්
අතිරේක ලේකම් (පාලන හා මුදල්) (ශ්‍රී.ලං.ප.සේ.විශේෂ ශ්‍රේණිය) 01
ප්‍රධාන මූල්‍ය නිලධාරී (ශ්‍රී.ලං.ග.සේ.විශේෂ ශ්‍රේණිය) 01
අතිරේක ලේකම් (පශු සම්පත් සංවර්ධන) (ශ්‍රී.ලං.ස.නි.සෞ.සේ. විශේෂ
අතිරේක ලේකම් (සංවර්ධන හා සැලසුම්) (ශ්‍රී.ලං.ප.සේ. විශේෂ ශ්‍රේණිය) 01
ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම් (පාලන) (ශ්‍රී.ලං.ප.සේ.) 01
ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම් (පශු සම්පත් පාලන) (ශ්‍රී.ලං.ප.සේ.) 01
ප්‍රධාන ගණකාධිකාරී (ශ්‍රී.ලං.ග.සේ) 01
අධ්‍යක්ෂ (ශ්‍රී.ලං.ස.නි. සෞ.සේ.) 03
අධ්‍යක්ෂ (ශ්‍රී.ලං.ප.සේ) 02
අධ්‍යක්ෂ ශ්‍රී.ලං.ක්‍ර.සේ) 01
සිවිල් ඉංජිනේරු (ශ්‍රී.ලං.ඉ.සේ) 01
ප්‍රධාන අභ්‍යන්තර විගණක (ශ්‍රී.ලං.ග.සේ) 01
නීති උපදේශක
සහකාර ලේකම් (පාලන) (ශ්‍රී.ලං.ප.සේ) 01
සහකාර ලේකම් (කම්කරු සබඳතා) 01
සහකාර ලේකම් (පශු සම්පත් පාලන) (ශ්‍රී.ලං.ප.සේ.) 01
ගණකාධිකාරී (ප්‍රසම්පාදන) (ශ්‍රී.ලං.ග.සේ.) 01
ගණකාධිකාරී (ගෙවීම්) (ශ්‍රී.ලං.ග.සේ.) 01
නියෝජ්‍ය /සහකාර අධ්‍යක්ෂ 04 පශු වෛද්‍ය 04 (ශ්‍රී.ලං.ස.නි. සෞ.සේ.)
සහකාර අධ්‍යක්ෂ (සංවර්ධන හා සැලසුම්) (ශ්‍රී.ලං.ප.සේ.) 02
නියෝජ්‍ය /සහකාර අධ්‍යක්ෂ (ශ්‍රී.ලං.ක්‍ර.සේ) 03
තාක්ෂණ නිලධාරී
සංවර්ධන නිලධාරී හා සමාන්තර සේවා
පරිපාලන නිලධාරී
භාෂා පරිවර්තක
සංවර්ධන නිලධාරී හා සමාන්තර සේවා
තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සහකාර
කළමනාකරණ සහකාර
නිශ්චල ඡායාරූප ශිල්පී
රියදුරු
කා.සේ.සේ
සංවර්ධන නිලධාරී හා සමාන්තර සේවා
කළමනා කරණ සහකාර
කා.සේ. සේ
සංවර්ධන නිලධාරී හා සමාන්තර සේවා
කළමනා කරණ සහකාර
කා.සේ.සේ
සංවර්ධන නිලධාරී හා සමාන්තර සේවා
කළමනා කරණ සහකාර
කා.සේ.සේ
සංවර්ධන නිලධාරී හා සමාන්තර සේවා
කළමනා කරණ සහකාර
කා.සේ. සේ
සංවර්ධන නිලධාරී හා සමාන්තර සේවා
කා.සේ. සේ
කළමනා කරණ සහකාර
කා.සේ. සේ
නීති නිලධාරී
නීති සහකාර
කා.සේ. සේ

# 03. මානව සම්පත් කළමනාකරණය

## 3.1. කාර්ය මණ්ඩල සංයුතිය

නව අමාත්‍යාංශ ස්ථාපිත වීමත් සමඟ නව කාර්යය මණ්ඩලයක් අනුමතව නොපවතින අතර මෙයට පූර්වගාමීව ග්‍රාමීය ආර්ථිකය පිළිබඳ අමාත්‍යාංශය ලෙස පැවති අවධියේ අනුමතව පැවති කාර්යය මණ්ඩලය මෙම අංශයේ කාර්ය මණ්ඩලය ලෙස තවදුරටත් සලකා ක්‍රියා කිරීම සිදුවේ.

***ග්‍රාමීය ආර්ථික කටයුතු හා පශු සම්පත් සංවර්ධන අංශය - අනුමත කාර්යය මණ්ඩලය***

| *අනු අංකය* | *තනතුර* | *සේවය* | *පන්තිය/ ශ්‍රේණිය* | *වැටුප් කේතය* | *අනුමත තනතුරු සංඛ්‍යාව* | *2018.12.31 දිනට සිටින කාර්යය මණ්ඩලය* |
|---|---|---|---|---|---|---|
| **1.** | ලේකම් | | | SL 4 -2016 | 01 | කෘ.අ.ලේ. |
| **2.** | අතිරේක ලේකම් | ශ්‍රී.ලං.ප.සේ. | විශේෂ | SL 3 - 2016 | 02 | 02 |
| **3.** | අතිරේක ලේකම් | ශ්‍රී.ලං.ස.නි.සෞ.සේ. | විශේෂ | SL 3 - 2016 | 01 | 01 (වැ.බ) |
| **4.** | ප්‍රධාන මූල්‍ය නිලධාරි | ශ්‍රී.ලං.ග.සේ. | විශේෂ | SL 3 - 2016 | 01 | 01 (වැ.බ) |
| **5.** | ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම් | ශ්‍රී.ලං.ප.සේ. | I | SL 1 - 2016 | 02 | 02 |
| **6.** | ප්‍රධාන ගණකාධිකාරී | ශ්‍රී.ලං.ග.සේ. | I | SL 1 - 2016 | 01 | 00 |
| **7.** | ප්‍රධාන අභ්‍යන්තර විගණක | ශ්‍රී.ලං.ග.සේ. | I | SL 1 - 2016 | 01 | 00 |
| **8.** | අධ්‍යක්ෂ | ශ්‍රී.ලං.ප.සේ. | I | SL 1 - 2016 | 02 | 02 |
| **9.** | අධ්‍යක්ෂ (සැලසුම්) | ශ්‍රී.ලං.ක්‍ර.සේ. | I | SL 1 - 2016 | 01 | 01 |
| **10.** | අධ්‍යක්ෂ | ශ්‍රී.ලං.ස.නි.සෞ. සේ. | I | SL 1 - 2016 | 03 | - |
| **11.** | නියෝජ්‍ය/ සහකාර අධ්‍යක්ෂ(සැලසුම්) | ශ්‍රී.ලං.ක්‍ර.සේ. | II/III | SL 1 - 2016 | 03 | 02 |
| **12.** | නියෝජ්‍ය /සහකාර අධ්‍යක්ෂ | ශ්‍රී.ලං.ප.සේ. | II/III | SL 1 - 2016 | 02 | 01 |
| **13.** | නියෝජ්‍ය/සහකාර අධ්‍යක්ෂ | ශ්‍රී.ලං.ස.නි.සෞ.සේ. | II/III | SL 1 - 2016 | 04 | 03 |
| **14.** | පශු වෛද්‍ය | ශ්‍රී.ලං.ස.නි.සෞ.සේ. | II/III | SL 1 - 2016 | 04 | 04 |
| **15.** | ගණකාධිකාරි | ශ්‍රී.ලං.ග.සේ. | II/III | SL 1 - 2016 | 02 | 01 |
| **16.** | සහකාර ලේකම් | ශ්‍රී.ලං.ප.සේ. | II/III | SL 1 - 2016 | 02 | 01 |
| **17.** | සිවිල් ඉංජිනේරු | ශ්‍රී.ලං.ඉ.සේ. | I /II/III | SL 1 - 2016 | 01 | 00 |
| **18.** | නීති උපදේශක | දෙපාර්තමේන්තුගත | - | SL 1 - 2016 | 01# | 01 |
| **19.** | නීති නිලධාරි | දෙපාර්තමේන්තුගත | - | SL 1 - 2016 | 01 | 01 |
| **20.** | ලේකම්ගේ සම්බන්ධීකරණ ලේකම් | තාවකාලික | - | රු.22,250/- රා.පරි.ච. 06/2006 (i) | 01 | 00 |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| **21.** | පරිපාලන නිලධාරී | රා.ක.ස.සේ | අධි | MN 7–2016 | 01 | 00 |
| **22.** | භාෂා පරිවර්තක | භාෂා පරිවර්තක සේවය | I/ II | MN 6–2016 | 02 | 02 |
| **23.** | සංවර්ධන නිලධාරී | සංවර්ධන නිලධාරී සේවය | I /II/III | MN 4–2016 | 530 | 519 |
| **24.** | සංවර්ධන සහකාර | ආශ්‍රිත සේවය | I /II/III | MN 4–2016 | 05* | 05 |
| **25.** | වැඩසටහන් සහකාර | ආශ්‍රිත සේවය | I /II/III | MN 4–2016 | 01* | 01 |
| **26.** | විමර්ශන සහකාර | ආශ්‍රිත සේවය | I /II/III | MN 4–2016 | 01* | 01 |
| **27.** | නීති සහකාර | ආශ්‍රිත සේවය | I /II/III | MN 4–2016 | 01 | 00 |
| **28.** | තාක්ෂණ නිලධාරී | ශ්‍රී.ලං.තා.සේ. | I /II/III | MN3– 2016 | 02 | 00 |
| **29.** | තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සහකාර | ශ්‍රී.ලං.තො.හා සං.තා.සේ. | 3 පන්තිය I/II/III | MT 1– 2016 | 01 | 01 |
| **30.** | නිශ්චල ඡායාරූප ශිල්පී | දෙපාර්තමේන්තුගත | | MT 3– 2016 | 01# | 01 |
| **31.** | නිශ්චල ඡායාරූප ශිල්පී | තාවකාලික | - | MT 1– 2016 | 01 | 00 |
| **32.** | වීඩියෝ කැමරා ශිල්පී | තාවකාලික | - | MT 1– 2016 | 01 | 00 |
| **33.** | රාජ්‍ය කළමනාකරණ සහකාර | රා.ක.ස.සේ. | I /II/III | MN 2–2016 | 32 | 34 |
| **34.** | රියදුරු | රියදුරු සේවය | විශේෂ I /II/III | PL 3– 2016 | 30 | 22 |
| **35.** | වීඩියෝ කැමරා සහයක | තාවකාලික | - | PL 1– 2016 | 01 | 00 |
| **36.** | කාර්යාල සේවක සේවයේ තනතුරු | කාර්යාල සේවක සේවය | විශේෂ I /II/III | PL 1– 2016 | 20 | 17 |
| | ***එකතුව*** | | | | ***666*** | ***626*** |

*ලකුණින් දක්වා ඇති තනතුරු, සංවර්ධන නිලධාරී සේවයට අන්තර්ග්‍රහණය වීමට යටත්ව අනුමත තනතුරු වේ. එම අනුමත තනතුරු අතුරෙන් සංවර්ධන නිලධාරි සේවයට අන්තර්ග්‍රහණය වූ නිලධාරීන් සංඛ්‍යාවට සමාන තනතුරු සංඛ්‍යාවක් යටපත් කර ඇත.

සංවර්ධන නිලධාරි සේවයේ අනුමතව තිබූ තනතුරු අතුරින් තනතුරු 76ක් කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතිය මත යටපත් කර ඇත.

# ලකුණින් දක්වා ඇති තනතුරු දරන්නාට පෞද්ගලික වන සේ අනුමත කර ඇත. ඒ අනුව තනතුරු දරන්නා වෙනත් තනතුරකට උසස් වීමෙන්, විශ්‍රාම යාමෙන්, ඉල්ලා අස්වීමෙන් හෝ මිය යාමෙන් පසුව මෙම තනතුර අහෝසි වේ.

## 3.2. ස්ථාන මාරු, ආයතනික කටයුතු

| අනු අංකය | විස්තර | නිම කළ සංඛ්‍යාව |
|---|---|---|
| **01.** | බඳවා ගැනීම් - ගරු අමාත්‍ය/නි.අමාත්‍ය කාර්යය මණ්ඩලය - තාවකාලික | 38 |
| | - ස්ථිර කාර්යය මණ්ඩලය | 08 |
| **02.** | උසස් කිරීම් | 04 |
| **03.** | විශ්‍රාම ගැනීම් | 08 |
| **04.** | ස්ථාන මාරුවීම් - ස්ථාන මාරු වී ගිය | 34 |
| | - ස්ථාන මාරු වී පැමිණි | 06 |

## 3.3. මානව සම්පත් සංවර්ධනය

නිලධාරීන්ගේ දැනුම, ආකල්ප හා කුසලතා වර්ධනය කිරීම පිණිස අමාත්‍යාංශය මඟින් දේශීය හා විදේශීය පුහුණු අවස්ථා ලබා දී ඇත.

| | **පුහුණුවීම් සඳහා සහභාගී වූ නිලධාරීන් සංඛ්‍යාව** | **පුහුණු වැඩසටහන් ගණන** |
|---|---|---|
| **විදේශ පුහුණු** | 18 | 16 |
| **දේශීය පුහුණු** | 37 | 17 |

## 3.4. ණය ලබා දීම

2018 වර්ෂය තුළ අමාත්‍යාංශ නිලධාරීන් සඳහා ලබා දුන් ණය මුදල් වටිනාකම රු.24,684,217 කි.

| අනු අංකය | ණය වර්ගය | 2018 | | |
|---|---|---|---|---|
| | | ඉල්ලීම් සංඛ්‍යාව | නිම කළ සංඛ්‍යාව | වටිනාකම |
| **1.** | ආපදා ණය | 161 | 161 | රු.24,684,217/- |

# 04. වාහන

## 4.1. 2018 වසර අවසානයේ අංශය සතුව පැවති භාවිතයට ගනු ලබන වාහන

| | ජීප් රථ | කාර් රථ | කැබ් රථ | ඩිෆෙන්ඩර් ජීප් රථ | වෑන් රථ | යතුරුපැදි |
|---|---|---|---|---|---|---|
| 1. | CAA – 0024 | KY – 4046 | PD – 2955 | CAH - 1634 | NB - 3395 | XU - 7010 |
| 2. | KW – 9982 | KO – 5114 | PF – 6980 | | 251 - 0747 | BBT – 5614 |
| 3. | KX - 8136 | KQ – 9375 | PE – 0010 | | | TT - 2974 |
| 4. | CAB - 6799 | KX – 8612 | PF – 5883 | | | |
| 5. | KQ - 8444 | KQ – 7500 | PF – 5884 | | | |
| 6. | KT - 8467 | KX – 7664 | PG – 4008 | | | |
| 7. | CAU - 3194 | KX – 7037 | PG – 2659 | | | |
| 8. | KY - 5292 | KQ- 6416 | JY – 2948 | | | |
| 9. | CAF - 4619 | KO – 4865 | PA – 1440 | | | |
| 10. | KX – 8135 | KB – 8264 | PA – 1438 | | | |
| 11. | GF – 9312 | KD – 0743 | PF – 6976 | | | |
| 12. | GF – 9288 | KD – 0737 | PD – 8931 | | | |
| 13. | KO – 0024 | JO – 6958 | 252 – 9655 | | | |
| 14. | 65 – 4043 | KP - 4164 | PG – 1773 | | | |
| 15. | KA - 6702 | | PF - 8209 | | | |
| | 15 | 14 | 15 | 01 | 02 | 03 |

2018 වසර අවසානයේ අංශය විසින් භාවිතයට ගත් වාහන සංඛ්‍යාව 50 කි. අංක 64 – 3179 දරන වාහනය ධාවනයෙන් ඉවත් කර ඇත. එබැවින් එය ඇතුළත් කර නැත. අංක CAA – 0024 දරන වාහනය කම්කරු සබඳතා, වෘත්තීය පුහුණු හා සමාජ සංවාද අමාත්‍යාංශය විසින් භාවිතා කරනු ලබන අතර, එහි හිමිකම පවරා දී නැත. අංක KO – 0024 දරන වාහනය ජාතික පශු සම්පත් සංවර්ධන මණ්ඩලය වෙත ලබා දී තිබෙන අතර, එහි ද හිමිකම පවරා දී නැත. එබැවින් එම වාහන ඇතුළත් කර ඇත.

# 05. නීති කටයුතු

නීති කටයුතු පිළිබඳ තොරතුරු

*2018 වර්ෂයේ කාර්ය සටහන*

| අධිකරණය | 2018.01.01 දිනට ඉතිරිව පැවති නඩු සංඛ්‍යාව | 2018 වර්ෂය තුළ ආරම්භ කළ නඩු සංඛ්‍යාව | නිම කළ සංඛ්‍යාව | 2018.12.31 දිනට ඉතිරි සංඛ්‍යාව |
|---|---|---|---|---|
| කම්කරු විනිශ්චය සභාව- ඇඹිලිපිටිය | 01 | - | 01 | - |
| මහේස්ත්‍රාත් අධිකරණය- ඇඹිලිපිටිය | 01 | - | - | 01 |
| කම්කරු විනිශ්චය සභාව- රත්නපුර | 01 | - | 01 | - |
| මහේස්ත්‍රාත් උසාවිය- හෝමාගම | 01 | 02 | 01 | 02 |
| මාතලේ දිසා අධිකරණය | 01 | - | - | 01 |
| දඹුල්ල දිසා අධිකරණය | 02 | 01 | 02 | 01 |
| දිස්ත්‍රික් උසාවිය - කොළඹ | 02 | 01 | 02 | 01 |
| අභියාචනාධිකරණය | 01 | - | 01 | - |
| ශ්‍රේෂ්ඨාධිකරණය | 03 | 01 | 02 | 02 |
| අනුරාධපුර දිසා අධිකරණය | 01 | - | 01 | - |
| කොළඹ දිසා අධිකරණය | - | 02 | 01 | 01 |
| පොල්ගහවෙල මහේස්ත්‍රාත් උසාවිය | - | 01 | - | 01 |

# 06. මූල්‍ය කළමනාකරණය

## 6.1 පුනරාවර්තන හා මූලධන වියදම්

ශීර්ෂය : 154 - ග්‍රාමීය ආර්ථිකය පිළිබඳ අමාත්‍යාංශය

01 - මෙහෙයුම් වැඩසටහන

01 - අමාත්‍ය කාර්යාලය

### පුනරාවර්තන වියදම්

| උප ව්‍යාපෘතිය | වැය ශීර්ෂය | මූල්‍යකරණය | අයිතමය විස්තරය | ශුද්ධ ප්‍රතිපාදනය රු. | 2018.12.31 දක්වා වියදම රු. | ශේෂය රු. |
|---|---|---|---|---|---|---|
| 0 | 1001 | 11 | වැටුප් හා වේතන | 12,000,000.00 | 8,481,809.00 | 3,518,191.00 |
| 0 | 1002 | 11 | අතිකාල හා නිවාඩු දින වැටුප් | 3,800,000.00 | 2,352,888.00 | 1,447,112.00 |
| 0 | 1003 | 11 | වෙනත් දීමනා | 6,000,000.00 | 3,648,389.00 | 2,351,611.00 |
| 0 | 1101 | 11 | දේශීය - ගමන් වියදම් | 1,150,000.00 | 1,063,115.00 | 86,885.00 |
| 0 | 1102 | 11 | විදේශීය - ගමන් වියදම් | 2,000,000.00 | 2,000,000.00 | - |
| 0 | 1201 | 11 | ලිපිද්‍රව්‍ය හා කාර්යාලයීය අවශ්‍යතා | 1,500,000.00 | 643,159.00 | 856,841.00 |
| 0 | 1202 | 11 | ඉන්ධන | 6,930,000.00 | 5,022,576.00 | 1,907,424.00 |
| 0 | 1203 | 11 | ආහාර පාන හා නිල ඇඳුම් | 100,000.00 | 99,980.00 | 20.00 |
| 0 | 1301 | 11 | වාහන | 7,000,000.00 | 6,988,705.00 | 11,295.00 |
| 0 | 1302 | 11 | යන්ත්‍ර සහ යන්ත්‍රෝපකරණ | 1,000,000.00 | 135,753.00 | 864,247.00 |
| 0 | 1303 | 11 | ගොඩනැගිලි හා ඉදිකිරීම් | 500,000.00 | - | 500,000.00 |
| 0 | 1401 | 11 | ප්‍රවාහන | 2,000,000.00 | 434,457.00 | 1,565,543.00 |
| 0 | 1402 | 11 | තැපැල් සහ සංනිවේදන | 2,600,000.00 | 1,464,053.00 | 1,135,947.00 |
| 0 | 1403 | 11 | විදුලිය සහ ජලය | 2,170,000.00 | 2,140,409.00 | 29,591.00 |
| 0 | 1409 | 11 | වෙනත් | 1,950,000.00 | 1,948,388.00 | 1,612.00 |
| | | | | **50,700,000.00** | **36,423,681.00** | **14,276,319.00** |

### මූලධන වියදම්

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| 0 | 2001 | 11 | ගොඩනැගිලි හා ඉදිකිරීම් | 1,500,000.00 | 1,000,000.00 | 500,000.00 |
| 0 | 2002 | 11 | යන්ත්‍ර සහ යන්ත්‍රෝපකරණ | 500,000.00 | - | 500,000.00 |
| 0 | 2003 | 11 | වාහන | 3,000,000.00 | 1,752,490.00 | 1,247,510.00 |
| 0 | 2102 | 11 | ගෘහ භාණ්ඩ සහ කාර්යාලයීය උපකරණ | 3,500,000.00 | 873,990.00 | 2,626,010.00 |
| 0 | 2103 | 11 | යන්ත්‍ර සහ යන්ත්‍රෝපකරණ | 2,000,000.00 | 129,480.00 | 1,870,520.00 |
| | | | | **10,500,000.00** | **3,755,960.00** | **6,744,040.00** |

ශීර්ෂය : 154 - ග්‍රාමීය ආර්ථිකය පිළිබඳ අමාත්‍යාංශය
01- මෙහෙයුම් වැඩසටහන
02 - පරිපාලන හා ආයතනික සේවා

## පුනරාවර්තන වියදම්

| උප ව්‍යාපෘතිය | වැය ශිර්ෂය | මූල්‍යකරණය | අයිතමය විස්තරය | ශුද්ධ ප්‍රතිපාදනය රු. | 2018.12.31 දක්වා වියදම රු. | ශේෂය රු. |
|---|---|---|---|---|---|---|
| 0 | 1001 | 11 | වැටුප් හා වේතන | 106,000,000.00 | 93,889,848.00 | 12,110,152.00 |
| 0 | 1002 | 11 | අතිකාල හා නිවාඩු දින වැටුප් | 4,100,000.00 | 3,868,181.00 | 231,819.00 |
| 0 | 1003 | 11 | වෙනත් දීමනා | 50,000,000.00 | 41,565,697.00 | 8,434,303.00 |
| 0 | 1101 | 11 | දේශීය - ගමන් වියදම් | 900,000.00 | 773,031.00 | 126,969.00 |
| 0 | 1102 | 11 | විදේශීය - ගමන් වියදම් | 1,500,000.00 | 1,322,830.00 | 177,170.00 |
| 0 | 1201 | 11 | ලිපිද්‍රව්‍ය හා කාර්යාලයීය අවශ්‍යතා | 3,765,000.00 | 3,700,598.00 | 64,402.00 |
| 0 | 1202 | 11 | ඉන්ධන | 4,500,000.00 | 4,498,869.00 | 1,131.00 |
| 0 | 1203 | 11 | ආහාර පාන හා නිල ඇඳුම් | 160,000.00 | 123,500.00 | 36,500.00 |
| 0 | 1301 | 11 | වාහන | 7,500,000.00 | 7,490,901.00 | 9,099.00 |
| 0 | 1302 | 11 | යන්ත්‍ර සහ යන්ත්‍රෝපකරණ | 550,000.00 | 505,604.00 | 44,396.00 |
| 0 | 1303 | 11 | ගොඩනැගිලි හා ඉදිකිරීම් | 35,000.00 | 14,125.00 | 20,875.00 |
| 0 | 1401 | 11 | ප්‍රවාහන | 2,950,000.00 | 2,911,133.00 | 38,867.00 |
| 0 | 1402 | 11 | තැපැල් සහ සංනිවේදන | 3,600,000.00 | 3,444,953.00 | 155,047.00 |
| 0 | 1403 | 11 | විදුලිය සහ ජලය | 6,000,000.00 | 6,000,000.00 | - |
| 0 | 1404 | 11 | බදු කුලී සහ පළාත් පාලන ආයතන බදු | 115,000,000.00 | 15,628,577.00 | 99,371,423.00 |
| 0 | 1409 | 11 | වෙනත් | 3,200,000.00 | 3,199,002.00 | 998.00 |
| 0 | 1506 | 11 | රජයේ සේවකයින් සඳහා දේපළ ණය පොලී | 900,000.00 | 900,000.00 | - |
| 0 | 1703 | 11 | රාජ්‍ය භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම | 200,000.00 | 46,800.00 | 153,200.00 |
| | | | | **310,860,000.00** | **189,883,649.00** | **120,976,351.00** |

## මූලධන වියදම්

| උප ව්‍යාපෘතිය | වැය ශිර්ෂය | මූල්‍යකරණය | ආයිතමය විස්තරය | ශුද්ධ ප්‍රතිපාදනය රු. | 2018.12.31 දක්වා වියදම රු. | ශේෂය රු. |
|---|---|---|---|---|---|---|
| | | | | | | |
| | 2001 | 11 | ගොඩනැගිලි සහ ඉදිකිරීම් | 2,000,000.00 | 2,000,000.00 | - |
| | 2002 | 11 | යන්ත්‍ර සහ යන්ත්‍රෝපකරණ | 1,000,000.00 | - | 1,000,000.00 |
| | 2003 | 11 | වාහන | 2,000,000.00 | - | 2,000,000.00 |
| | 2102 | 11 | ගෘහ භාණ්ඩ සහ කාර්යාලයීය උපකරණ | 2,000,000.00 | 1,314,276.00 | 685,724.00 |
| | 2103 | 11 | යන්ත්‍ර සහ යන්ත්‍රෝපකරණ | 2,000,000.00 | 952,520.00 | 1,047,480.00 |
| | 2401 | 11 | කාර්ය මණ්ඩල පුහුණු | 4,000,000.00 | 1,963,028.00 | 2,036,972.00 |
| | | | | **13,000,000.00** | **6,229,824.00** | **6,770,176.00** |

ශීර්ෂය : 154 - ග්‍රාමීය ආර්ථිකය පිළිබඳ අමාත්‍යාංශය
02 - සංවර්ධන වැඩසටහන
03 - සංවර්ධන ව්‍යාපෘති

## මූලධන වියදම්

| උප ව්‍යා පෘතිය | වැ ය ශීර්ෂය | මූල්‍යාකරණය | අයිතමය විස්තරය | ශුද්ධ ප්‍රතිපාදනය රු. | 2018.12.31 දක්වා වියදම රු. | ශේෂය රු. |
|---|---|---|---|---|---|---|
| 1 | 2506 | 11 | ආර්ථික මධ්‍යස්ථාන පිහිටුවීම | 28,170,000.00 | 27,538,181.00 | 631,819.00 |
| 3 | 2506 | 11 | සාම්ප්‍රදායික හස්ත කර්මාන්ත ගම්මාන සංවර්ධනය කිරීම | 25,000,000.00 | 24,241,782.00 | 758,218.00 |
| 4 | 2506 | 11 | මැටි කර්මාන්ත ගම්මාන සංවර්ධනය කිරීම | 5,000,000.00 | 4,567,448.00 | 432,552.00 |
| 8 | 2506 | 11 | කිතුල් සංවර්ධන ව්‍යාපෘතිය | 16,350,000.00 | 12,926,732.00 | 3,423,268.00 |
| 9 | 2506 | 11 | ග්‍රාමීය ආර්ථික ප්‍රවර්ධන වැඩසටහන | 670,520,000.00 | 621,591,506.00 | 48,928,494.00 |
| 10 | 2506 | 11 | විශේෂිත ආර්ථික මධ්‍යස්ථාන පිහිටුවීම-වවුනියාව,මඩකලපුව | 128,068,200.00 | 127,855,491.00 | 212,709.00 |
| 11 | 2506 | 11 | ශීතාගාර දෙකක් ඉදිකිරීම | 2,871,800.00 | 1,252,441.00 | 1,619,359.00 |
| | | | | **875,980,000.00** | **819,973,581.00** | **56,006,419.00** |

ශීර්ෂය : 154 - ග්‍රාමීය ආර්ථිකය පිළිබඳ අමාත්‍යාංශය
02 - සංවර්ධන වැඩසටහන
05 -පශු සම්පත් සංවර්ධනය

## පුනරාවර්තන වියදම්

| උප ව්‍යා පෘතිය | වැ ය ශීර්ෂය | මූල්‍යාකරණය | අයිතමය විස්තරය | ශුද්ධ ප්‍රතිපාදනය රු. | 2018.12.31 දක්වා වියදම රු. | ශේෂය රු. |
|---|---|---|---|---|---|---|
| 0 | 1001 | 11 | වැටුප් හා වේතන | 120,739,510.00 | 112,190,983.00 | 8,548,527.00 |
| 0 | 1002 | 11 | අතිකාල හා නිවාඩු දින වැටුප් | 2,050,000.00 | 1,996,194.00 | 53,806.00 |
| 0 | 1003 | 11 | වෙනත් දීමනා | 48,260,490.00 | 48,260,488.00 | 2.00 |
| 0 | 1101 | 11 | දේශීය - ගමන් වියදම් | 1,450,000.00 | 1,408,236.00 | 41,764.00 |
| 0 | 1102 | 11 | විදේශීය - ගමන් වියදම් | 1,500,000.00 | 1,359,270.00 | 140,730.00 |
| 0 | 1201 | 11 | ලිපිද්‍රව්‍ය හා කාර්යාලයීය අවශ්‍යතා | 800,000.00 | 470,203.00 | 329,797.00 |
| 0 | 1202 | 11 | ඉන්ධන | 2,680,000.00 | 2,420,198.00 | 259,802.00 |
| 0 | 1203 | 11 | ආහාර පාන හා නිල ඇඳුම් | 50,000.00 | 50,000.00 | - |
| 0 | 1301 | 11 | වාහන | 3,400,000.00 | 3,341,404.00 | 58,596.00 |
| 0 | 1302 | 11 | යන්ත්‍ර සහ යන්ත්‍රෝපකරණ | 500,000.00 | 279,979.00 | 220,021.00 |
| 0 | 1303 | 11 | ගොඩනැගිලි හා ඉදිකිරීම් | 220,000.00 | - | 220,000.00 |
| 0 | 1401 | 11 | ප්‍රවාහන | 1,000,000.00 | 997,331.00 | 2,669.00 |
| 0 | 1402 | 11 | තැපැල් සහ සංනිවේදන | 1,000,000.00 | 1,000,000.00 | - |
| 0 | 1403 | 11 | විදුලිය සහ ජලය | 1,000,000.00 | 1,000,000.00 | - |
| 0 | 1409 | 11 | වෙනත් | 1,000,000.00 | 762,979.00 | 237,021.00 |
| 0 | 1506 | 11 | රජයේ සේවකයින් සඳහා දේපළ ණය පොලී | 700,000.00 | 374,858.00 | 325,142.00 |
| | | | | **186,350,000.00** | **175,912,123.00** | **10,437,877.00** |

ශීර්ෂය : 154 - ග්‍රාමීය ආර්ථිකය පිළිබඳ අමාත්‍යාංශය

02 - සංවර්ධන වැඩසටහන

05 -පශු සම්පත් සංවර්ධනය

**මූලධන වියදම්**

| උප ව්‍යාපෘතිය | වැය ශීර්ෂය | මූල්‍යකරණය | අයිතමය විස්තරය | ශුද්ධ ප්‍රතිපාදනය රු. | 2018.12.31 දක්වා වියදම රු. | ශේෂය රු. |
|---|---|---|---|---|---|---|
| | 2001 | 11 | ගොඩනැගිලි සහ ඉදිකිරීම් | 13,000,000.00 | 9,869,642.00 | 3,130,358.00 |
| | 2002 | 11 | යන්ත්‍ර සහ යන්ත්‍රෝපකරණ | 500,000.00 | - | 500,000.00 |
| | 2003 | 11 | වාහන | 1,500,000.00 | - | 1,500,000.00 |
| | 2102 | 11 | ගෘහ භාණ්ඩ සහ කාර්යාලයීය උපකරණ | 2,500,000.00 | 160,127.00 | 2,339,873.00 |
| | 2103 | 11 | යන්ත්‍ර සහ යන්ත්‍රෝපකරණ | 1,000,000.00 | - | 1,000,000.00 |
| | 2401 | 11 | කාර්ය මණ්ඩල පුහුණු | 2,000,000.00 | 238,612.00 | 1,761,388.00 |
| 3 | 2506 | 11 | දියර කිරි පරිභෝජනය ප්‍රචලිත කිරීම | 46,310,000.00 | 25,575,333.00 | 20,734,667.00 |
| 4 | 2507 | 11 | සතුන් අභිජනනය කිරීමේ ගොවිපල ස්ථාපනය කිරීම | 40,060,000.00 | 15,459,528.00 | 24,600,472.00 |
| 14 | 2506 | 11 | මධ්‍ය කාලීන පශු සම්පත් සංවර්ධන වැඩසටහන | 50,940,000.00 | 25,596,126.00 | 25,343,874.00 |
| 19 | 2506 | 11 | කුඩා හා මධ්‍ය පරිමාණ කුකුලු ගොවිපළ සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතිය | 15,790,000.00 | 11,491,349.00 | 4,298,651.00 |
| 23 | 2506 | 11 | සූකර කර්මාන්තය සංවර්ධනය කිරීම | 10,650,000.00 | 7,895,648.00 | 2,754,352.00 |
| 29 | 2507 | 12 | බඩල්ගම කිරි නිෂ්පාදනාගාරයක් ස්ථාපනය කිරීම (ශ්‍රී ලංකා/ඩෙන්මාර්ක්) | 2,000,000,000.00 | 1,414,599,082.00 | 585,400,918.00 |
| | | 17 | | 375,000,000.00 | 374,334,497.00 | 665,503.00 |
| 31 | 2509 | 11 | ජාතික ආහාර නිෂ්පාදන වැඩසටහන | 107,800,000.00 | 78,720,552.00 | 29,079,448.00 |
| 32 | 2507 | 11 | ශ්‍රී ලාංකික මී ගව ගහනයේ ජාන වැඩි දියුණු කිරීම තුළින් මී කිරි නිෂ්පාදනය ඉහළ නැංවීම | 470,000.00 | 467,500.00 | 2,500.00 |
| 33 | 2506 | 17 | කිරි ගවයින් 20,000ක් ආනයනය කිරීම | 160,000,000.00 | 19,379,300.00 | 140,620,700.00 |
| 34 | 2506 | 12 | කුඩා පරිමාණ කිරි නිෂ්පාදකයින්ගේ සමුපකාර සමිති සංවර්ධනය කිරීම | 900,000,000.00 | 1,129.00 | 899,998,871.00 |
| | | 17 | | 121,000,000.00 | 8,200.00 | 120,991,800.00 |
| | | | | **3,848,520,000.00** | **1,983,796,625.00** | **1,864,723,375.00** |

ශීර්ෂය : 154 - ග්‍රාමීය ආර්ථිකය පිළිබඳ අමාත්‍යාංශය

**2018.12.31 දිනට පුනරාවර්තන මූලධන වියදම**

| වියදම් වර්ගය | ශුද්ධ ප්‍රතිපාදනය රු. | 2018.12.31 දක්වා වියදම රු. | ශේෂය රු. |
|---|---|---|---|
| පුනරාවර්තන වියදම් | 547,910,000.00 | 402,219,456.00 | 145,690,543.00 |
| මූලධන වියදම් | 4,748,000,000.00 | 2,813,755,990.00 | 1,934,244,010.00 |
| **එකතුව** | **5,295,910,000.00** | **3,215,975,446.00** | **2,079,934,553.00** |

## 6.2 විගණන විමසුම් පිළිබඳ තොරතුරු

| විස්තරය | ලද සංඛ්‍යාව | පිළිතුරු යැවූ සංඛ්‍යාව |
|---|---|---|
| විගණකාධිපති විගණන විමසුම් | 24 | 24 |
| අභ්‍යන්තර විගණන විමසුම් | 04 | 04 |

# 07. අභ්‍යන්තර විගණන අංශය

**ප්‍රගතිය**

2018 වර්ෂය වෙනුවෙන් මෙම අංශය මේ යටතේ ඇති ආයතන විගණනය සඳහා විගණන සැලැස්මක් පිළියෙල කර ඇති අතර, ඒ යටතේ ඇති කරුණු සහ ඉන් පරිබාහිර කරුණු යටතේ 2018 වසර තුළ පහත සඳහන් කටයුතු සහ විමර්ශන කටයුතු සිදුකර ඇත.

| කරුණ | සංඛ්‍යාව |
|---|---|
| 2018 වසර තුළ පවත්වන ලද විගණන කළමනාකරණ කමිටු රැස්වීම් | 04 |
| අමාත්‍යාංශයේ සියලුම අංශවල වාර්ෂික ප්‍රගතිය ආවරණය වන පරිදි විගණනයට ලක් කර ඉදිරිපත් කර ඇති කාර්තු වාර්තා | 04 |
| අංශය හා ඒ යටතේ ඇති ආයතනයන්හි කරුණු සම්බන්ධයෙන් සිදුකෙරුණු විමර්ශන වාර්තා | 05 |
| මූල්‍ය, මානව සම්පත් සහ සංවර්ධන කටයුතුවල කාර්යක්ෂමතාව සහ ඵලදායීත්වය වැඩි කිරීම සඳහා යෝජනා සහිතව ඉදිරිපත් කරන ලද අභ්‍යන්තර විගණන විමසුම් | 11 |
| අංශය හා ඒ යටතේ ඇති ආයතනවල කටයුතු සම්බන්ධව සිදුකරන ලද ක්ෂේත්‍ර විගණන පරීක්ෂණ | 07 |

# 08. කාර්යසාධන ප්‍රගතිය

ග්‍රාමීය ජනතාවගේ ජීවනෝපාය සංවර්ධනය කිරීම, පශු සම්පත් නිෂ්පාදන වර්ධනය කිරීම තුළින් දේශීය ඉල්ලුම සපුරාලීම, පශු සම්පත් නිෂ්පාදන සඳහා අලෙවි ජාලයක් ඇති කිරීම, කෘෂි නිෂ්පාදන මිලට ගැනීම, ගබඩා කිරීම, නිෂ්පාදිත අලෙවිකරණය සම්බන්ධීකරණය තුළින් දේශීය හා අන්තර්ජාතික වෙළෙඳපොළ තුළ ක්‍රියාත්මක කාර්යයන් ආශ්‍රයෙන් මෙම අංශයේ කාර්යයන් ක්‍රියාත්මක වන අතර, මෙම ක්ෂේත්‍රයන්හි ප්‍රගමනයට අංශය මඟින් ලබා දිය යුතු දායකත්වය මෙම වසරේදී අඛණ්ඩව ලබා දෙමින් මෙම අංශයේ ඉලක්ක සපුරා ගැනීමට ක්‍රියා කර ඇත.

ආහාර සුරක්ෂිතතාවය සඳහා වන දායකත්වය මෙන්ම, ජීවනෝපාය මාර්ගයක් වශයෙන්ද, පශු සම්පත් ක්ෂේත්‍රය දේශීය ආර්ථිකය තුළ වැදගත් වේ. දැනට දළ වශයෙන් මෙම අංශයේ පවුල් මිලියනයක් පමණ නිරත වන අතර, මින් බහුතරයක් ග්‍රාමීය අංශය නියෝජනය කරනු ලබයි. වඩාත් සෞඛ්‍යාරක්ෂිත සහ ගුණාත්මක ආකාරයෙන් සත්ත්ව නිෂ්පාදන වෙළෙඳපොළට ඉදිරිපත් කිරීම, ඉහළ යන දේශීය ඉල්ලුම සපුරාලීම සහ එමඟින් පශු නිෂ්පාදන ආනයනය සඳහා වාර්ෂිකව වැයවන විදේශ විනිමය සීමා කිරීම යන අරමුණු පෙරදැරිව මෙම අංශය මඟින් පශු සම්පත් ක්ෂේත්‍රයට අදාළව විවිධ වැඩසටහන් සහ ව්‍යාපෘති සැලසුම් කර ක්‍රියාත්මක කර ඇත.

එමෙන්ම රට තුළ සත්ත්ව රෝග පැතිරීම වළක්වාලීම, මැඩපැවැත්වීම, පශු සම්පත් ක්ෂේත්‍රයට අදාළ පර්යේෂණ හා සංවර්ධන කටයුතු වලට තාක්ෂණික නායකත්වය සැපයීම සහ සත්ත්ව අභිජනන කටයුතු සඳහා විශේෂඥ උපදෙස් හා සහාය සේවාවන් සැපයීම සම්බන්ධව කටයුතු කරන අතර මුළු දිවයිනම ආවරණය වන පරිදි සිදුකරනු ලබන වෙනත් ප්‍රධාන කටයුතු අතර, සත්ත්ව පාලනය පිළිබඳ පුහුණුකරුවන් පුහුණු කිරීම, එම කර්මාන්තය නගාසිටුවීමට අදාළ ව්‍යාපෘති සැකසීම, ආර්ථික ඇගයීම් සහ විශේෂ සංවර්ධන වැඩසටහන්ද ඇතුළත් වන අතර, පශු සම්පත් ක්ෂේත්‍රයේ සංවර්ධනයට පහසුකම් සැකසීම සඳහා අදාළ නීති සම්පාදනය කර ක්‍රියාත්මක කිරීමද සිදුවේ.

සත්ත්ව පාලනය එළදායී ව්‍යාපාරයක් ලෙස පවත්වාගෙන යාමට අවශ්‍ය දැනුම ගොවීන්ට ලබා දීම සඳහා ක්‍රියාත්මක කරන වැඩසටහන් අතර, එක් එක් දේශගුණික කලාප වලට සුදුසු වන පරිදි ගොවිපොළවල නුමුහුන් හා දෙමුහුන් සතුන් අභිජනන වැඩසටහන් ක්‍රියාත්මක කර ඇත. පස නිසරු වීම වැළැක්වීමට හා පසෙහි සාරවත් බව වර්ධනය කිරීමට පරිසර හිතකාමී භූමි පරිහරණ ශිල්ප ක්‍රම හඳුන්වා දී ඇත.

ග්‍රාමීය ජනතාවගේ ආර්ථිකය නගාසිටුවීම සඳහා ග්‍රාමීය ජීවනෝපාය සංවර්ධන ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය මූලාධාර සම්පාදනය හා ග්‍රාමීය යටිතල පහසුකම් සහ කුඩා ව්‍යවසාය සංවර්ධනය අරමුණු කර ගනිමින් ක්‍රියාත්මක වැඩසටහන් අතර තෝරාගත් දිස්ත්‍රික්කවල ග්‍රාමීය යටිතල පහසුකම් හා ජීවනෝපාය සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කර ඇත.

වාණිජමය වශයෙන් විභවයක් ඇති කිතුල් නිෂ්පාදන කර්මාන්ත සංවර්ධනය කිරීම මඟින් ග්‍රාමීය ජනතාවගේ ස්වයං රැකියා අවස්ථා වැඩිදියුණු කිරීම, කිතුල් කාර්මිකයන් සහ ව්‍යවසායකයින් සඳහා ශක්තිමත් ආර්ථිකයක් ගොඩනැංවීම, දේශීය මෙන්ම විදේශීය වෙළෙඳපොළ සඳහා ගුණාත්මක කිතුල් නිෂ්පාදනය ප්‍රචලිත කිරීම, කිතුල් ආශ්‍රිත නිෂ්පාදන විවිධාංගීකරණය සඳහා කිතුල් කර්මාන්තය ආශ්‍රිතව පවතින ගැටලු හා නීතිමය ගැටලු අවම කිරීම සඳහා අවධානය යොමු කර ඇත.

එමෙන්ම සාම්ප්‍රදායික හස්ත කර්මාන්ත ගම්මාන සංවර්ධනය හා මැටි භාණ්ඩ නිෂ්පාදන ගම්මාන සංවර්ධනය තුළින් හස්ත කර්මාන්ත ක්ෂේත්‍රයේ නියුක්තිකයන්ගේ ජීවනෝපාය වැඩිදියුණු කිරීම සඳහා හා මෙම කර්මාන්තයේ නිෂ්පාදන සඳහා වෙළෙඳපොළ අවස්ථා පුළුල් කිරීමට අවශ්‍ය ව්‍යාපෘතීන් ක්‍රියාත්මක කිරීම මෙම වසර තුළ ඉටු කර ඇත.

කෘෂි අලෙවි සංවර්ධන උපාය මාර්ගයක් ලෙස ග්‍රාමීය ප්‍රදේශවල නිෂ්පාදන අලෙවි කර ගැනීම සඳහා පහසුකම් සැපයීමේ අරමුණින් පිහිටුවා ඇති විශේෂිත ආර්ථික මධ්‍යස්ථාන සම්බන්ධීකරණය හා මෙහෙයවීම් කටයුතු මෙම අංශය මඟින් සිදුවන අතර, දැනට ක්‍රියාත්මක මට්ටමේ පවතින ආර්ථික මධ්‍යස්ථාන සංඛ්‍යාව 15ක් වන අතර වවුනියාව හා මඩකලපුව ආර්ථික මධ්‍යස්ථාන විවෘත කිරීමට නියමිතය. විශේෂිත ආර්ථික මධ්‍යස්ථාන ප්‍රධාන ප්‍රභේද තුනකින් සමන්විත වන අතර ඒවා කෘෂි නිෂ්පාදන ප්‍රදේශ කේන්ද්‍ර කර ගත් තොග මධ්‍යස්ථාන, කෘෂි නිෂ්පාදන හා අත්‍යාවශ්‍ය ආහාර ද්‍රව්‍ය තොග/ සිල්ලර වශයෙන් බෙදාහැරීමේ මධ්‍යස්ථාන, නාගරික ප්‍රදේශ කේන්ද්‍ර කර ගත් සිල්ලර අලෙවි මධ්‍යස්ථාන වශයෙන් බෙදී ඇත. මෙම වසරේ ආර්ථික මධ්‍යස්ථානයන්හි යටිතල පහසුකම් සංවර්ධන කටයුතු සිදු කර ඇත.

මේ අනුව ප්‍රධාන විෂයය ක්ෂේත්‍ර 4ක් යටතේ ක්‍රියාත්මක වන මෙම මෙම අංශයේ කාර්යභාරය 2018 වසර තුළ මනා මූල්‍ය කළමනාකාරීත්වයකින් යුතුව විධිමත්ව ඉටු කිරීමට හැකි වී ඇත.

# 09. පශු සම්පත් සංවර්ධන අංශය

ආහාර සුරක්ෂිතතාවය සඳහා වන දායකත්වය මෙන්ම, ජීවනෝපාය මාර්ගයක් වශයෙන්ද පශු සම්පත් ක්ෂේත්‍රය දේශීය ආර්ථිකය තුළ වැදගත්වේ. කිරි ගව, එළු, කුකුළු හා සූකර යන අංශයන්හි දැනට දළ වශයෙන් පවුල් මිලියනයක් පමණ නිරත වන අතර, මින් බහුතරයක් ග්‍රාමීය අංශය නියෝජනය කරනු ලබයි.

වඩාත් සෞඛ්‍යාරක්ෂිත සහ ගුණාත්මක ආකාරයෙන් සත්ත්ව නිෂ්පාදන වෙළෙඳපොළට ඉදිරිපත් කිරීම මගින් ඉහළ යන දේශීය ඉල්ලුම සපුරාලීම සහ එමගින් පශු නිෂ්පාදන ආනයනය සඳහා වාර්ෂිකව වැයවන විදේශ විනිමය සීමා කිරීම යන අරමුණු පෙරදැරිව පශු සම්පත් සංවර්ධන අංශය විසින් විවිධ වැඩසටහන් සහ ව්‍යාපෘති සැලසුම් කර ක්‍රියාත්මක කරනු ලබයි. සමාලෝචිත වර්ෂය තුළදී පශු සම්පත් සංවර්ධන අංශය මගින් ක්‍රියාත්මක කරන ලද සංවර්ධන වැඩසටහන් සහ ව්‍යාපෘතීන් පහත පරිදි වේ.

### 9.1 *2018 වර්ෂය තුළදී පශු සම්පත් සංවර්ධන අංශය මගින් ක්‍රියාත්මක කරන ලද සංවර්ධන වැඩසටහන් හා ව්‍යාපෘතීන්ගේ ප්‍රගතිය*

| අනු අංකය | වැඩසටහන / ව්‍යාපෘතිය | 2018 අයවැය ප්‍රතිපාදන (රු.මි) | භෞතික ප්‍රගතිය (%) | මූල්‍ය ප්‍රගතිය* (රු.මි.) | විශේෂ කරුණු |
|---|---|---|---|---|---|
| 1. | දියර කිරි පරිභෝජනය ප්‍රවර්ධනය හා ප්‍රචලිත කිරීම | 46.31 | 80 | 37.78 | තවත් රු.මි.11.47 ක මුදලක් ප්‍රතිපූර්ණය කිරීමට ඇත. |
| 2. | අභිජනන ගොවිපොළවල් ස්ථාපනය කිරීම | 40.06 | 80 | 31.67 | තවත් රු.මි.15.26ක මුදලක් ප්‍රතිපූර්ණය කිරීමට ඇත. |
| 3. | පශු සම්පත් සංවර්ධන මධ්‍යකාලීන වැඩසටහන | 50.94 | 60 | 32.56 | තවත් රු.මි.7.36ක මුදලක් ප්‍රතිපූර්ණය කිරීමට ඇත. |
| 4. | කුඩා හා මධ්‍ය පරිමාණ කුකුළු ගොවිපොළවල් ඇති කිරීම | 15.79 | 77 | 12.74 | තවත් රු.මි.0.9576ක මුදලක් ප්‍රතිපූර්ණය කිරීමට ඇත. |
| 5. | ශ්‍රී ලංකාවේ සූකර කර්මාන්තය නගාසිටුවීම | 10.65 | 99 | 7.8 | තවත් රු.මි.0.01ක මුදලක් ප්‍රතිපූර්ණය කිරීමට ඇත. |
| 6. | බඩල්ගම නව කිරි සැකසුම් මධ්‍යස්ථානයක් ස්ථාපිත කිරීම (ශ්‍රී ලංකා / ඩෙන්මාර්ක්) | 2,375.0 | 85 | 1,632.92 | - |
| 7. | ආහාර නිෂ්පාදන ජාතික වැඩසටහන | 107.8 | 100 | 102.51 | තවත් රු.මි.24.57ක මුදලක් ප්‍රතිපූර්ණය කිරීමට ඇත |
| 8. | කිරි ගවයින් 20,000ක් ආනයනය (ශ්‍රී ලංකා / ඕස්ට්‍රේලියා) | 160.0 | 20 | 8.19 | - |
| 9. | කුඩා පරිමාණ කිරි සැකසුම් මධ්‍යස්ථාන ස්ථාපනය කිරීම (ශ්‍රී ලංකා /ප්‍රංශ) | 1,028.0 | 10 | 0.01 | - |
| **එකතුව** | | **3834.55** | | **1,866.18** | |

* මූල්‍ය ප්‍රගතිය අතැති බිල්පත් සමඟ ඉදිරිපත් කර ඇත

## 9.2. දියර කිරි පරිභෝජනය ප්‍රවර්ධනය හා ප්‍රචලිත කිරීමේ වැඩසටහන

### 9.2.1. කිරි නිෂ්පාදනයේ ගුණාත්මකභාවය ඉහළ නැංවීම සඳහා ගව නිවාස වැඩි දියුණු කිරීමේ ව්‍යාපෘතිය

ශ්‍රී ලංකාවේ කිරි නිෂ්පාදනය ඉහළ මට්ටමක පවතින ප්‍රදේශවල නිෂ්පාදනය කරන කිරිවල ගුණාත්මකභාවය කෙරෙහි බුරුලු ප්‍රදාහ රෝගය අහිතකර අන්දමින් බලපායි. මනා ලෙස සකස් කරන ලද ගව නිවාස පවත්වා ගැනීම තුළින් මෙම රෝගය අවම කිරීමේ හැකියාව ඇත. ගව නිවාසයන්හි බිම නිසි ලෙස සකස් කිරීම මෙහිලා වැදගත්වේ.

මෙම ව්‍යාපෘතිය ගව නිවාසවල බිමෙහි තත්ත්වය වැඩිදියුණු කිරීම සඳහා ක්‍රියාත්මක කරන ලදී. මෙහිදී එක් ගොවිපොළක් සඳහා සියයට 50ක රජයේ දායකත්වයක් යටතේ රුපියල් 30,000ක උපරිමයකට යටත්ව ගව නිවාසයේ බිම කොන්ක්‍රීට් කිරීම සඳහා ආධාර මුදලක් ලබාදේ.

මේ යටතේ දිස්ත්‍රික් මට්ටමින් කිරි ගොවිපොළ 330 ක් සංවර්ධනය කිරීමට ඉලක්ක කර ඇත. 2018 වසර සඳහා ව්‍යාපෘති වාර්තා 337 ක් අනුමත කර ඇති අතර, ව්‍යාපෘති 310ක් සම්පූර්ණ කර ඇත.

### 9.2.2. දිළිඳු බව තුරන්කිරීම උදෙසා කාන්තා මූලික පවුල් සඳහා කිරි ගවයින් බෙදාදීමේ ව්‍යාපෘතිය

පශු සම්පත් ක්ෂේත්‍රයේ නියැලී සිටින බහුතරයක් සුළු පරිමාණ කිරි ගොවීන් වන අතර, ඒ සඳහා කාන්තාවන් වැඩි ශ්‍රම දායකත්වයක් ලබාදේ. මෙම ව්‍යාපෘතිය යටතේ කාන්තා මූලික පවුල් විසින් පවත්වාගෙන යනු ලබන කිරි ගොවිපොළ සඳහා සියයට 50ක රජයේ දායකත්වයක් යටතේ රුපියල් 60,000ක උපරිමයකට යටත්ව උසස් ආරයේ කිරි ගවයෙකු ලබාදේ. මේ තුළින් එම කාන්තාවන් සවිබල ගැන්වීම හා දිළිඳුකම තුරන් කිරීම සඳහා ද මනා පිටුවහලක් සපයයි.

පළාත් සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තු හරහා ක්‍රියාත්මක වන මෙම ව්‍යාපෘතිය යටතේ දිවයින පුරා ප්‍රතිලාභීන් 170 දෙනෙකු සඳහා ප්‍රතිලාභ ලබා දීමට ඉලක්ක කර ඇති අතර, සමාලෝචිත කාල සීමාව වන විට ව්‍යාපෘති යෝජනා 181 ක් අනුමත කර ඇත. 2018 වසර අවසන් වන විට ව්‍යාපෘති 166ක් සම්පූර්ණ කර ඇත.

### 9.2.3. කිරි නිෂ්පාදනය ඉහළ නැංවීම තුළින් දියර කිරි පරිභෝජනය ප්‍රචලිත කිරීම

මේ යටතේ පාසල් දරුවන් මෙන්ම වැඩිහිටි ප්‍රජාව අතරද දියර කිරි පරිභෝජනය ප්‍රචලිත කිරීම සඳහා දැනුවත් කිරීමේ වැඩසටහන් පවත්වා කිරි ආශ්‍රිත නිෂ්පාදන ලබා දීම සිදු කෙරේ. මේ සඳහා අපේක්ෂිත ආයෝජනය රු. මි. 12ක් වන අතර, සමාලෝචිත කාල සීමාව තුළදී වැඩසටහන් 1,289ක් පවත්වා ඇත. තවද, තෝරාගත් කිරි නිෂ්පාදන පර්ෂද 3ක් ඉලක්ක කර ගනිමින් සෞඛ්‍යාරක්ෂිත කිරි නිෂ්පාදනයට අත්‍යවශ්‍ය කිරි කෑන් ලබාදීමද සිදු කෙරේ.

## 9.3. අභිජනන ගොවිපොළවල් ස්ථාපනය කිරීම

### 9.3.1. අභිජනන ගොවිපොළවල් පිහිටුවීම

දේශීය කිරි නිෂ්පාදනය ඉහළ නැංවීම සඳහා අවශ්‍ය උසස් ආරයේ කිරි දෙනුන්ගේ හිඟකම මගහරවා ගැනීමේ අරමුණින් දිවයින පුරා පළාත් මට්ටමින් අභිජනන ගොවිපොළවල් පිහිටුවීම සිදු කරන ලදී. 2018 වසර තුළ සත්ත්ව අභිජනන ගොවිපොළ 105ක් පිහිටුවීමට සැලසුම් කර ඇති අතර මේ සඳහා අපේක්ෂිත ආයෝජනය රු.මි. 10.5කි. ඉලක්කගත ගොවිපොළ අතරින් ගොවිපොළ 104ක ඉදිකිරීම් කටයුතු අවසන්

කර ඇත. අභිජනනය සඳහා සුදුසු සතුන් මිලදී ගැනීම සහ ගවගාල් සාදාදීම මේ යටතේ සිදු කළ අතර, මේ සඳහා රු.මි. 10.4ක් වැය කර ඇත.

***2018 වසර තුළ ක්‍රියාත්මක අභිජනන ගොවිපොළ සංඛ්‍යාව***

| *පළාත* | *අභිජනන ගොවිපොළ* | |
|---|---|---|
| | ***ඉලක්කය*** | ***අනුමත කරන ලද සංඛ්‍යාව*** |
| *මධ්‍යම* | *20* | *20* |
| *නැගෙනහිර* | *06* | *04* |
| *උතුර* | *15* | *15* |
| *උතුරු මැද* | *12* | *12* |
| *වයඹ* | *20* | *21* |
| *සබරගමුව* | *06* | *03* |
| *දකුණ* | *10* | *10* |
| *ඌව* | *10* | *10* |
| *බස්නාහිර* | *06* | *09* |
| *එකතුව* | ***105*** | ***104*** |





*ක්‍රියාත්මක කරනු ලැබූ අභිජනන ගොවිපොළක දර්ශනයක්....*

### 9.3.2. තෘණ සංවර්ධනය හා සංරක්ෂණය කිරීම සඳහා උපකරණ ලබාදීම

සත්ත්ව පෝෂණය වැඩිදියුණු කිරීම තුළින් සතුන්ගේ අභිජනන හැකියාව වැඩි කිරීම සහ කිරි නිෂ්පාදනය ඉහළ නැංවීම මෙමඟින් බලාපොරොත්තුවේ. මේ යටතේ තෘණ වගාව වැඩිදියුණු කිරීම සඳහා අවශ්‍ය යන්ත්‍රෝපකරණ හා තෘණ සංරක්ෂණ (සයිලේජ්) නිපදවීමට අවශ්‍ය උපකරණ ලබා දීම සිදු කෙරේ.

මෙමගින් එක් පළාතකින් ප්‍රතිලාභීන් 11 දෙනෙකු බැගින් තෝරාගත් ප්‍රතිලාභීන් 99ක් සඳහා එක් ප්‍රතිලාභියෙකු සඳහා සියයට 50ක ප්‍රතිලාභී දායකත්වය යටතේ රුපියල් 50,000ක උපරිමයකට යටත්ව රජයේ දායකත්වය ලබාදෙන අතර, මුළු මුදල රුපියල් 100,000ක වටිනාකමකට සයිලේජ් සෑදීමට අවශ්‍ය උපකරණ මිලදී ගැනීම සඳහා ආධාර මුදල් ලබා දේ. ගොවිපොළ 104ක කටයුතු සම්පූර්ණයෙන්ම අවසන්ව ඇත. මේ සඳහා ආයෝජිත මුදල රු.මි. 4.11කි.

### 9.3.3. බැටළු හා ගව ශුක්‍ර වඩ් ආනයනය කිරීම

ශ්‍රී ලංකාවේ බැටළු කර්මාන්තය නගාසිටුවීම සඳහා ජාතික පශු සම්පත් සංවර්ධන මණ්ඩලයට බැටළුවන් ආනයනය කිරීමට සැලසුම් කළද පසුව බැටළු හා ගව ශුක්‍ර වඩ් ආනයනය කිරීමට තිරණය වූ අතර, එම ආනයන කටයුතු අවසන් කර ඇත. මේ සඳහා ජාතික පශු සම්පත් සංවර්ධන මණ්ඩලය වෙත රු.මි. 8ක ප්‍රතිපාදන වෙන් කර ඇත.

### 9.3.4. මධ්‍යම පළාතේ ආදර්ශ අභිජනන ගොවිපොළක් ස්ථාපිත කිරීම

මේ යටතේ පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ පශු වෛද්‍ය පීඨයට අයත් පුහුණු ගොවිපොළ පරිශ්‍රයේ දෙනුන් 50 ක් සඳහා නවීන ගව ගාලක් ඉදිකරමින් පවතී. මධ්‍යම පළාතේ කිරි ගොවීන් අතර කිරි දෙනුන් හා පැටවුන් බෙදා හැරීමේ අරමුණින් ක්‍රියාත්මක වන මෙහි කටයුතු ආරම්භ කර ඇත. මේ සඳහා ආයෝජිත මුදල රු.මි. 5කි.

### 9.3.5. සත්ත්ව අභිජනනය පිළිබඳ පුහුණු වැඩමුළුව

ආසියා පැසිපික් කලාපයේ ඒකාබද්ධ ග්‍රාමීය සංවර්ධනය පිළිබඳ මධ්‍යස්ථානය සත්ත්ව අභිජනනය, ගොවිපොළ කළමනාකරණය, සත්ත්ව පෝෂණය තේමා කර ගනිමින් දින 05 ක නේවාසික පුහුණු වැඩසටහනක් පවත්වන ලදී. මෙම පුහුණු වැඩමුළුව සඳහා සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය සේවයේ නිළධාරීන් 40 දෙනෙකු සහභාගී වූ අතර එය පේරාදෙණිය අඛණ්ඩ අධ්‍යාපන ආයතනයේ දී පැවැත්විණ. මේ සඳහා බංග්ලාදේශ සම්පත්දායකයින් දෙදෙනෙකුගේ දායකත්වය ලබා ගන්නා ලදී. මෙයට අමතරව මධ්‍යම පළාතේ නිලධාරීන් පුහුණු කිරීමේ වැඩසටහන් 02ක් ක්‍රියාත්මක කර ඇත.

### 9.3.6. ඌව පළාතේ විශේෂ අභිජනන ගොවිපොළ ස්ථාපනය කිරීම

ඌව පළාත තුළ තෝරාගත් ගොවිපොළ 25ක විශේෂ අභිජනන ගොවිපොළවල් ස්ථාපිත කිරීමේ නියාමක ව්‍යාපෘතියක් සැලසුම් කරන ලදී. මෙය තෝරාගත් ගොවිපොළ සඳහා ආනයනික දෙනුන් ගේ පැටවුන් ලබා දීම සඳහා ක්‍රියාත්මක කෙරේ.

මේ යටතේ එක් ප්‍රතිලාභියෙකුට සියයට 50ක ප්‍රතිලාභී දායකත්වය යටතේ රුපියල් 200,000ක උපරිමයකට යටත්ව රජයේ දායකත්වය ලබාදෙන අතර, සමාලෝචිත කාල සීමාව අවසන් වන විට ව්‍යාපෘති 04ක කටයුතු අවසන් කර ඇත.

## 9.4. පශු සම්පත් සංවර්ධන මධ්‍යකාලීන වැඩසටහන

පශු සම්පත් ක්ෂේත්‍රය දියුණු කිරීම සඳහා උතුරු පළාතෙහි පවතින විශාල විභවය තුළ පශු වෛද්‍ය කාර්යාල හා අනෙකුත් යටිතල පහසුකම් ස්ථාපනය කිරීම මඟින් පශු සම්පත් ක්ෂේත්‍රයේ සේවා සැපයුම වැඩිදියුණු කිරීමට කටයුතු කර ඇත. සමාලෝචිත කාල සීමාව තුළ ඉදිකරන ලද නිල නිවාස පිළිබඳ විස්තර පහත පරිදිවේ

| *නිල නිවාසය* | *භෞතික ප්‍රගතිය (%)* |
|---|---|
| *මන්නාරම දිස්ත්‍රික්කයේ මඩු පශු වෛද්‍ය නිල නිවාසය* | *100* |
| *මුලතිව් දිස්ත්‍රික්කයේ මුලතිව් පුදුකුඩුඉරිප්පු පශු වෛද්‍ය නිල නිවාසය* | *100* |
| *මුලතිව් දිස්ත්‍රික්කයේ තුනුක්කායි ගොවිපොළේ පශු වෛද්‍ය නිල නිවාසය* | *100* |
| *කිලිනොච්චි දිස්ත්‍රික්කයේ කරච්චායි පශු වෛද්‍ය නිල නිවාසය* | *80* |
| *වවුනියා දිස්ත්‍රික්කයේ ඉරට්ටපෙරියකුලම් පශු වෛද්‍ය නිල නිවාසය* | *95* |
| *මන්නාරම දිස්ත්‍රික්කයේ මන්නාරම පශු වෛද්‍ය කාර්යාල ගොඩනැගිල්ල* | *15* |
| *යාපනය දිස්ත්‍රික්කයේ තිරුණවේලි බහුකාර්ය ගොඩනැගිල්ල ඉදිකිරීම* | *10* |

## 9.5. සුළු හා මධ්‍ය පරිමාණ කුකුළු ගොවිපොළ සංවර්ධන වැඩසටහන

කුකුළු නිෂ්පාදනයන්ගෙන් රට ස්වයංපෝෂිත කර අපනයන වෙළෙඳපොළ ඉලක්ක කරගනිමින් කටයුතු කිරීමේ අරමුණින් මෙම වැඩසටහන ක්‍රියාත්මක වේ. මේ යටතේ, නව ව්‍යවසායකයින් කුකුළු පාලන ක්ෂේත්‍රය සඳහා යොමු කිරීමත්, දැනට සිටින ව්‍යවසායකයින් දිරිමත් කිරීමත් සිදු කරන අතර බිත්තර, කුකුළු මස් හා සත්ත්ව ආහාර නිෂ්පාදනය මෙන්ම කුකුළු පැටවුන් නිෂ්පාදනය ප්‍රචලිත කිරීමත් අපේක්ෂා කෙරේ. සෑම පුද්ගලයෙකුටම සතියකට බිත්තර 03ක් සහ වසරකට කුකුළු මස් කිලෝ ග්‍රෑම් 10ක්

පරිභෝජනය කිරීමට හැකිවන පරිදි කුකුළු මස් හා බිත්තර නිෂ්පාදනය ප්‍රවර්ධනය කිරීමට මෙම වැඩසටහන මගින් බලාපොරොත්තුවේ.

2018 වසර තුළදී සුළු හා මධ්‍ය පරිමාණ කුකුළු ගොවිපොළ 1,750ක් ස්ථාපනය කිරීමට ඉලක්ක කරන ලද අතර, සමාලෝචිත කාල සීමාව තුළදී සුළු පරිමාණ ගොවිපොළ 1,835 ක් පිහිටුවා ඇත. මීට අමතරව, විශේෂ වැඩසටහනක් ලෙස ඌව පළාතේ මොණරාගල දිස්ත්‍රික්කයේ ප්‍රතිලාභීන් 252 දෙනෙකු සහ මධ්‍යම පළාතේ නාඋල පශු වෛද්‍ය කොට්ඨාශයේ ප්‍රතිලාභීන් 18ක් වෙත සුළු පරිමාණ කුකුළු ගොවිපොළ පිහිටුවීම සඳහා කිකිළි පැටවුන් 10 බැගින් ලබා දීම සඳහා රු.මි.1.02ක් ආයෝජනය කරන ලදී.

කුඩා පරිමාණ සත්ත්ව ආහාර නිෂ්පාදනාගාර 08 ක් හා මස් සකස් කිරීමේ මධ්‍යස්ථාන 18ක් ස්ථාපනය කිරීමට ආයෝජිත මුදල රු.මි.3.792කි. එසේම විශේෂ වැඩසටහන් යටතේ මොණරාගල දිස්ත්‍රික්කය තුළ බිත්තර හා මස් පරිභෝජනය පිළිබඳ ගැබිනි මව්වරුන් දැනුවත් කිරීමේ වැඩසටහනක් පවත්වා ඇත.

## 9.6. ශ්‍රී ලංකාවේ සූකර කර්මාන්තය සංවර්ධන වැඩසටහන

සූකර කර්මාන්තයේ ඵලදායීතාවය ඉහළ නැංවීම සඳහා ජාතික පශු සම්පත් සංවර්ධන මණ්ඩලයට අයත් හොරකැලේ ගොවිපොළ වෙත උසස් ආරයේ සූකර ශුක්‍ර ආනයනය කර ඇති අතර, ඒ සඳහා ආයෝජිත මුදල රු.මි. 3කි. තවද, සමාලෝචිත කාල සීමාව තුළදී දීපව්‍යාප්තව පවතින කුඩා පරිමාණ සූකර ගොවිපොළ 61ක් පරිසර හිතකාමී තත්ත්වයට නගාසිටුවීමට අවශ්‍ය පියවර ගෙන ඇති අතර, මේ සඳහා ආයෝජිත මුදල රු.මි.3.004කි. වයඹ පළාතේ වන්නිගම ඒකාබද්ධ ගොවිපොළ සංවර්ධන හා පුහුණු මධ්‍යස්ථානයේ පවතින ආදර්ශ සූකර ගොවිපොළෙහි සුළු පරිමාණ සූකර ඝාතකාගාරයක් ඉදිකිරීමට රු.මි. 1.002ක මුදලක් ආයෝජනය කර ඇත.

## 9.7. බඩල්ගම නව කිරි සැකසුම් මධ්‍යස්ථානයක් ස්ථාපනය කිරීම

මිල්කෝ සමාගමට අයත් කොළඹ නාරාහේන්පිට පිහිටි කිරි සැකසුම් කර්මාන්තශාලාව, බඩල්ගම පිහිටි ජාතික පශු සම්පත් සංවර්ධන මණ්ඩලයට අයත් සිරිංගපාත ගොවිපොළෙහි ස්ථාපනය කිරීමට තීරණය කරන ලදී. මෙම ව්‍යාපෘතිය ඩෙන්මාර්ක් රජයේ සහයෝගීතාව මත ක්‍රියාත්මක වන අතර, එහි පළමු අදියර යටතේ, කර්මාන්තශාලාව ඉදිකිරීම සඳහා 2016.05.18 දින මුල්ගල තැබීම සිදු කරන ලදී. සමාලෝචිත කාල සීමාව අවසන් වනවිට අත්කර ගෙන ඇති ප්‍රගතිය පහත පරිදිවේ.

| *කාර්යය* | *භෞතික ප්‍රගතිය (%)* | *ආයෝජනය* |
|---|---|---|
| *කිරි කර්මාන්තශාලා ගොඩනැගිල්ලේ ඉදිකිරීම් කටයුතු* | *99* | |
| *පරිපාලන හා කාර්යාල ගොඩනැගිල්ල* | *88* | |
| *ආපන ශාලා ගොඩනැගිල්ල, සේවක පහසුකම් ඇතිකිරීම* | *85* | |
| *කාර්යමණ්ඩල නිල නිවාස සහ ආරක්ෂක කුටි ඉදිකිරීම* | *88* | |
| *විදුලි ජනන ඒකකය ස්ථාපිත කිරීම* | *100* | |
| *යාන්ත්‍රික සහ විදුලි ආශ්‍රිත සවිකිරීම් කටයුතු* | *47* | |
| *යන්ත්‍රෝපකරණ කොටස් සහ ඉදිකිරීම් ද්‍රව්‍ය බහාලුම් 43 ක් ආනයනය කිරීම* | | *යූරෝ මිලියන 56.81* |
| *ආනයනික යන්ත්‍රෝපකරණ සඳහා දේශීය අරමුදලින් බදු ගෙවීම* | | *රු.මි.375* |

## 9.8. ආහාර නිෂ්පාදන ජාතික වැඩසටහන

ග්‍රාමීය ප්‍රජාවගේ ජීවන තත්ත්වය ඉහළ නැංවීමේ අරමුණින් ජාතික මට්ටමින් ක්‍රියාත්මක කරනු ලබන ආහාර නිෂ්පාදන ජාතික වැඩසටහන යටතේ පහත සඳහන් ව්‍යාපෘතීන් ක්‍රියාත්මක කරනු ලබයි.

### 9.8.1. කුඩා පරිමාණ කිරි ගොවිපොළ සවිබල ගැන්වීමේ ව්‍යාපෘතිය

ආහාර නිෂ්පාදන ජාතික වැඩසටහනෙහි ප්‍රතිපාදන යටතේ කුඩා පරිමාණ කිරි ගොවිපොළවල ගුණාත්මක කිරි නිෂ්පාදනය දිරිගැන්වීමේ අරමුණින් මෙය ක්‍රියාත්මක කෙරේ. එක් ප්‍රතිලාභියෙකු වෙත රුපියල් 60,000 ක උපරිමයකට යටත්ව සියයට 50 ක සහනාධාර මුදලක් මේ යටතේ ලබාදේ. පළාත් සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තු සහ මිල්කෝ (ප්‍රයිවට්) ලිමිටඩ් හරහා ක්‍රියාත්මක කරන මෙම ව්‍යාපෘතිය යටතේ සමාලෝචිත කාල සීමාව තුළ පළාත් සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තු මගින් ව්‍යාපෘති 781 ක් සහ මිල්කෝ (ප්‍රයිවට්) ලිමිටඩ් මඟින් ව්‍යාපෘති 180ක් ද ක්‍රියාත්මක කර ඇත.

### 9.8.2. කුඩා පරිමාණ එළු ගොවිපොළ සංවර්ධන ව්‍යාපෘතිය

කුඩා පරිමාණ එළු පාලනයේ නියුතු ගොවීන්ගේ ආර්ථිකය නගාසිටුවීම සහ දේශීය එළු කිරි හා එළු මස් නිෂ්පාදනය ඉහළ නැංවීම තුළින් ජනතාවගේ පෝෂණ මට්ටම වැඩිදියුණු කිරීමේ අරමුණින් ක්‍රියාත්මක වන මෙම ව්‍යාපෘතිය යටතේ, එළු ගොවිපොළවල් 332 ක් පිහිටුවීම සඳහා රු.මි. 18.5 ක් ආයෝජනය කර ඇත. මෙහිදී එක් ප්‍රතිලාභියෙකු වෙනුවෙන් පිරිමි සතෙකු හා ගැහැණු සතුන් 04 හෝ 05 දෙනෙකු මිලට ගැනීම සඳහා රුපියල් 60,000 ක මුදලක් ලබා දෙන ලදී.

### 9.8.3. කුඩා පරිමාණ කුකුළු ගොවිපොළ සංවර්ධන ව්‍යාපෘතිය

කුකුළු නිෂ්පාදන සඳහා ගෘහස්ථ මට්ටමේ දායකත්වය ලබා දීම තුළින් ජනතාවගේ පෝෂණ මට්ටම ඉහළ නැංවීමේ අරමුණින් ක්‍රියාත්මක වන මෙම ව්‍යාපෘතිය යටතේ, එක් ප්‍රතිලාභියෙකු වෙත මසක් වයසැති කිකිළි පැටවුන් 10 බැගින් ලබාදෙන අතර, ප්‍රතිලාභීන් විසින් කුකුළු නිවාසය සාදාගැනීම හා සතුන් සඳහා අවශ්‍ය ආහාර ලබා දීම සිදුකළ යුතුවේ.

මේ යටතේ, සමාලෝචිත කාල සීමාව වන විට සුළු හා මධ්‍ය පරිමාණ කුකුළු ගොවිපොළවල් 8,064ක් දීපව්‍යාප්තව ස්ථාපිත කර ඇත. මේ සඳහා රු. මි. 29.28ක් ආයෝජනය කර ඇත.

## 9.9. කිරි ගවයින් ආනයනය කිරීම

දේශීය දියර කිරි නිෂ්පාදනය ඉහළ නැංවීමේ අරමුණින් උසස් ආරයේ ගැබ්බර කිරි දෙනුන් 20,000 ක් ඕස්ට්‍රේලියාවෙන් හා නවසීලන්තයෙන් ආනයනය කිරීමට අපේක්ෂිතය. මේ තුළින් කිරි ගව පාලනයේ නිරතවන මධ්‍ය හා මහා පරිමාණ ව්‍යවසායකයින් වෙත මෙම එළදෙනුන් ලබා දී වඩා කාර්යක්ෂම හා ගුණාත්මක කිරි නිෂ්පාදනයක් ඇති ගොවිපොළවල් දීපව්‍යාප්තව පිහිටුවීමට බලාපොරොත්තුවේ. මෙම සතුන්ගෙන් ජනිතවන පළමු පරම්පරාවේ පැටවුන් නිෂ්පාදන කටයුතුවලට යොදවා ගැනීමට මෙන්ම දේශීය ආරයන් වැඩිදියුණු කර ගැනීමට දායක කර ගැනීමටද අපේක්ෂිතය.

ඒ අනුව, මෙම ව්‍යාපෘතියේ පළමු අදියර යටතේ 2017 මැයි මාසයේ දී කිරි ගවයින් 2,000ක් නවසීලන්තයෙන්ද, දෙසැම්බර් මස කිරි ගවයින් 3,000ක් ඕස්ට්‍රේලියාවෙන්ද ආනයනය කරන ලදුව එම සතුන් සමස්ත ආයෝජකයින් 68 දෙනෙකු වෙත ලබා දී ඇත. 2018.12.31 වන විට පැටව් උපත් 4,814ක් සිදු වී ඇති අතර දේශීය කිරි නිෂ්පාදනයට කිරි ලීටර 17,852,605ක ප්‍රමාණයක් එක් කර ඇත. මෙම වැඩසටහනේ දෙවන අදියර සඳහා නැවතත් පුවත්පත් දැන්වීම් පළ කර ආනයනික ගැබ්බර දෙනුන් ඇති කිරීමට කැමති ව්‍යවසායකයින්ගෙන් අයදුම්පත් කැඳවා ඇති අතර, සුදුසු ව්‍යවසායකයින් තෝරා ගැනීමේ කටයුතු සිදු කරමින් පවතී. මේ සම්බන්ධ සෞඛ්‍ය ප්‍රමිතීන් ලබා ගැනීම සම්බන්ධයෙන් ප්‍රමාදයක් ඇති වූ අතර, එය ලද වහාම ආනයන කටයුතු ආරම්භ කිරීමට හැකිවේ.

## 9.10. කුඩා පරිමාණ කිරි නිෂ්පාදකයින්ගේ සමූපකාර සමිති සංවර්ධනය කිරීම

ශ්‍රී ලංකාවේ කිරි කර්මාන්තය නගා සිටුවීමේ අරමුණින් ක්‍රියාත්මක වන මෙම ව්‍යාපෘතියේ මූලික අරමුණ වනුයේ අගය එකතු කළ කිරි නිෂ්පාදන අදාළ ප්‍රදේශවලම නිෂ්පාදනය කර කිරි පරිභෝජනය ප්‍රචලිත කිරීම මගින් ප්‍රජාවේ පෝෂණ මට්ටම ඉහළ නැංවීමය. මේ යටතේ තෝරාගත් කුඩා පරිමාණ කිරි සැපයුම් මධ්‍යස්ථාන 06ක් සංවර්ධනය කිරීමට බලාපොරොත්තු වන අතර, මේ සඳහා අපේක්ෂිත ආයෝජනය යුරෝ මිලියන 13.9කි. මේ සම්බන්ධයෙන් වන මූල්‍ය එකඟතා ගිවිසුම ශ්‍රී ලංකා රජය සහ ප්‍රංශ ජනරජය අතර 2017/12/27 දින අත්සන් තබා ඇත.

ව්‍යාපෘතියට අදාළ සැපයුම් කොන්ත්‍රාත් ගිවිසුම අත්සන් කිරීමට අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලැබී ඇති අතර, මූල්‍ය ගිවිසුම 2018.09.28 දින අත්සන් කරන ලදී. මෙම ව්‍යාපෘතිය යටතේ ප්‍රතිලාභීන් වෙත සපයනු ලබන ණය මුදල් ආපසු අය කර ගැනීමේ ක්‍රමවේදය පිළිබඳව රාජ්‍ය බැංකු සමඟ මේ වනවිට සාකච්ඡා කරමින් පවතී.

# 10. සංවර්ධන හා සැලසුම් අංශය මඟින් සමාලෝචිත වර්ෂයේදී ඉටු කරන ලද කාර්යභාරය

ග්‍රාමීය ජනතාව ආර්ථිකව නගාසිටුවීම සඳහා සමාලෝචිත වර්ෂයේදී අමාත්‍යාංශයේ සංවර්ධන හා සැලසුම් අංශය මඟින් ක්‍රියාත්මක කරන ලද වැඩසටහන් හා ව්‍යාපෘතීන් පිළිබඳ විස්තර පහත දක්වා ඇත.

## 10.1. ග්‍රාමීය ආර්ථික සංවර්ධන ව්‍යාපෘති

### 10.1.1. කිතුල් සංවර්ධන ව්‍යාපෘතිය

මේ යටතේ කිතුල් ව්‍යවසායකයින් සංවර්ධනය කිරීම සඳහා ප්‍රමුඛතාවය ලබා දුන් අතර, දිස්ත්‍රික් මට්ටමින් කිතුල් නිෂ්පාදන අලෙවි සැල් ස්ථාපිත කිරීම, කිතුල් පැණි, හකුරු හා ආශ්‍රිත නිෂ්පාදන වැඩිදියුණු කිරීම, ප්‍රමිතියෙන් යුතු ගුණාත්මක නිෂ්පාදන වෙළෙඳපොළ තුළ ප්‍රචලිත කිරීම සඳහා විවිධ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම සිදු කර ඇත.

කිතුල් කර්මාන්තය සංවර්ධනය කිරීම සඳහා සිදු කරන ලද මැදිහත්වීම් පහත පරිදි වේ.

- කිතුල් නිෂ්පාදකයින්ගේ නිෂ්පාදන අලෙවිය සඳහා අලෙවි මධ්‍යස්ථාන ඉදිකිරීමට අරමුදල් සැපයීම
- රක්ෂිත වනාන්තරවල කිතුල් මල් මැදීමේ හැකියාව සම්බන්ධව කිතුල් කාර්මිකයින් දැනුවත් කිරීම
- ප්‍රාදේශීය ලේකම් කාර්යාල මගින් නව සුරාබදු පනත පිළිබඳව කිතුල් කාර්මිකයින් දැනුවත් කිරීම
- කිතුල් ආශ්‍රිත කර්මාන්ත සංවර්ධනය කිරීම සඳහා අවශ්‍ය මූල්‍ය සහාය ලබා දීම
- කිතුල් කාර්මිකයින් සඳහා පුහුණු වැඩසටහන් පැවැත්වීම, භාණ්ඩ හා උපකරණ ලබා දීම

2018 වසරේදී කිතුල් සංවර්ධන ව්‍යාපෘතිය සඳහා දේශීය අරමුදලින් රු. මි. 15ක ප්‍රතිපාදන ලබා දී ඇත. දිස්ත්‍රික්ක 13ක ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස 52ක ප්‍රතිලාභීන් 2,200 දෙනෙකු සඳහා සිදුකළ සංවර්ධන කටයුතු පහත දැක්වේ.

***කිතුල් ගම්මාන සංවර්ධන ව්‍යාපෘතිය - 2018 (ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස අනුව)***

| දිස්ත්‍රික්කය | ප්‍රතිලාභ ලබා දුන් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස | මුළු ප්‍රතිපාදන (රු.) |
|---|---|---|
| ගාල්ල | යක්කලමුල්ල,වැලිවිටිය, දිවිතුර,බෝපෙ පෝද්දල, නෙළුව,තවලම,නියාගම | 1,740,154.64 |
| මාතර | පිටබැද්දර,පස්ගොඩ,අකුරැස්ස,මාලිම්බඩ,කොටපොල | 1,444,175.26 |
| කළුතර | වලල්ලාවිට,අගලවත්ත,ඉංගිරිය,බුලත්සිංහල,පාලින්දනුවර | 1,585,530.93 |
| මාතලේ | උකුවෙළ,මාතලේ,රත්තොට | 770,567.01 |
| බදුල්ල | ඇල්ල,සොරණාතොට, ඌවපරණගම | 997,363.19 |
| මහනුවර | පූජාපිටිය,තුම්පනේ,මැදදුම්බර,උඩුදුම්බර,දෙල්තොට,උඩපළාත | 1,213,005.15 |
| රත්නපුර | තිව්තිගල,ඉඹුල්පේ,බලන්ගොඩ,කිරිඇල්ල,ඇහැළියගොඩ,අයගම | 1,564,097.94 |
| නුවරඑළිය | කොත්මලේ,අඹගමුව,හඟුරන්කෙත | 398,041.24 |
| කෑගල්ල | දෙහිඕවිට,බුලත්කොහුපිටිය,දැරණියගල, වරකාපොල,අරණායක | 1,337,010.31 |
| හම්බන්තොට | කටුවන | 1,013,720.62 |
| මොණරාගල | මැදගම,මඩුල්ල,මොණරාගල | 617,474.23 |
| ගම්පහ | දොම්පෙ | 17,350.52 |
| අම්පාර | අම්පාර | 199,020.62 |
| එකතුව | **52** | **12,897,511.53** |

### 10.1.2. සාම්ප්‍රදායික හස්ත කර්මාන්ත ගම්මාන සංවර්ධනය කිරීම

මෙම ව්‍යාපෘතිය සඳහා 2018 වර්ෂයට රු.මි. 25ක ප්‍රතිපාදන දේශීය අරමුදල් මගින් ලබා දී ඇත. සාම්ප්‍රදායික හස්ත කර්මාන්තකරුවන් සඳහා නව තාක්ෂණික දැනුම ලබාදීම තුළින් නව නිර්මාණකරණයේ යෙදීම සඳහා ඉඩ ප්‍රස්ථා ලබා දීම, වෙළඳපොළ ශක්තිමත් කිරීම, වැඩිදියුණු කළ නිෂ්පාදන අලෙවිය සඳහා යොමු කිරීම හා නවීන උපකරණ හඳුන්වාදීම, පාරම්පරික කර්මාන්ත හා ශිල්පීය කුසලතා සඳහා නව තාක්ෂණික වටිනාකමක් ලබා දීම, හස්ත කර්මාන්තවල නියුක්ත වූවන්ගේ ජීවනෝපාය වැඩිදියුණු කිරීම සහ හස්ත කර්මාන්ත නිෂ්පාදන සඳහා වෙළෙඳපොළ අවස්ථා පුළුල් කිරීම මේ තුළින් බලාපොරොත්තු වේ.

දීපව්‍යාප්තව තෝරාගත් දිස්ත්‍රික්ක 22ක ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස 93 ක සාම්ප්‍රදායික හස්ත කර්මාන්ත ගම්මාන සංවර්ධනය කිරීමට කටයුතු කර ඇත. මේ යටතේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස මට්ටමින් හඳුනාගනු ලැබූ සාම්ප්‍රදායික හස්ත කර්මාන්ත ගම්මාන ශක්තිමත් කිරීම සඳහා අවශ්‍ය පුහුණුව, තාක්ෂණික දැනුම, අමුද්‍රව්‍ය හා අමුද්‍රව්‍ය වගා කිරීමට අවශ්‍ය සහය, උපකරණ හා භාණ්ඩ ලබා දීම සඳහා දිස්ත්‍රික් ලේකම්වරුන් වෙත අරමුදල් ලබා දී ඇත. මේ යටතේ සංවර්ධනය කිරීම සඳහා අවධානය යොමු කරන ලද කර්මාන්ත පහත සඳහන් වේ.

| ***සාම්ප්‍රදායික හස්ත කර්මාන්ත සංවර්ධනය යටතේ හඳුනාගෙන ඇති ක්ෂේත්‍රයන්*** | | | |
|---|---|---|---|
| *ස්වර්ණාභරණ නිෂ්පාදනය* | *බතික් කර්මාන්තය* | *පාපිසි නිෂ්පාදන* | *තල් ආශ්‍රිත නිෂ්පාදන* |
| *පන් ගම්මාන සංවර්ධනය* | *බීරළු රේන්ද කර්මාන්තය* | *උණ ලී ආශ්‍රිත නිර්මාණ* | *වානේ කර්මාන්තය* |
| *කම්මල් කර්මාන්තය* | *ලාක්ෂා කර්මාන්තය* | *බට ආශ්‍රිත නිෂ්පාදන* | *දැව ආශ්‍රිත නිර්මාණ* |
| *චිත්‍ර මූර්ති කැටයම් ශිල්පීන් සංවර්ධනය* | *කොහු ආශ්‍රිත නිෂ්පාදන සංවර්ධනය* | *පොල් කටු ආශ්‍රිත නිෂ්පාදන* | *ගල් කැටයම් නිර්මාණ ශිල්පීන් සංවර්ධනය* |
| *වේවැල් ආශ්‍රිත නිෂ්පාදන* | *පිත්තල කර්මාන්තය* | | |

***සාම්ප්‍රදායික හස්ත කර්මාන්ත ගම්මාන සංවර්ධනය***
***(ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස අනුව)***

| ***දිස්ත්‍රික්කය*** | ***ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස*** | ***ගම්මාන සංඛ්‍යාව*** | ***ප්‍රතිලාභීන් සංඛ්‍යාව*** | ***මුළු ප්‍රතිපාදන ප්‍රමාණය (රු.)*** | ***මූල්‍ය ප්‍රගතිය (රු.)*** | ***භෞතික ප්‍රගතිය (%)*** |
|---|---|---|---|---|---|---|
| *මහනුවර* | *යටිනුවර,පස්බාගේ කෝරළේ, අකුරණ, පාතදුම්බර* | *5* | *45* | *1,086,956.00* | *1,000,870.00* | *100* |
| *කෑගල්ල* | *දෙහිඕවිට,වරකාපොල, රඹුක්කන,ගලිගමුව* | *4* | *78* | *880,795.82* | *850,600.30* | *100* |
| *පොළොන්නරුව* | *දිඹුලාගල* | *1* | *4* | *102,061.86* | *100,200.00* | *100* |
| *රත්නපුර* | *කලවාන,පැල්මඩුල්ල, කුරුවිට ඇහැළියගොඩ, ගොඩකවෙල* | *5* | *86* | *1,039,429.90* | *1,031,800.00* | *100* |
| *පුත්තලම* | *මාදම්පෙ,මහවැව,මුන්දලම, නාත්තන්ඩිය* | *5* | *77* | *745,051.55* | *728,200.00* | *100* |
| *අනුරාධපුර* | *පලුගස්වැව,පලාගල,මිහින්තලය ගලෙන්බිඳුණුවැව, තලාව* | *5* | *50* | *1,367,628.30* | *1,350,200.10* | *100* |
| *කළුතර* | *කළුතර,බුලත්සිංහල,මදුරාවල, හොරණ,අගලවත්ත* | *6* | *66* | *1,515,100.93* | *1,500,652.00* | *100* |
| *හම්බන්තොට* | *සූරියවැව,තංගල්ල,බෙලිඅත්ත, කටුවන, අඟුණකොළපැලැස්ස* | *7* | *154* | *1,581,958.76* | *1,581,000.40* | *100* |
| *මාතර* | *තිහගොඩ,කඹුරුපිටිය,පස්ගොඩ මුලටියන,හක්මණ,පිටබැද්දර, කඩවත්සතර,අතුරලිය, මාතර, වැලිපිටිය,කිරින්ද පුහුල්වැල්ල, දික්වැල්ල,දෙවිනුවර* | *26* | *95* | *3,733,419.85* | *3,595,512.10* | *100* |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| *ගාල්ල* | *බෝපෙ, පෝද්දල,කඩවත්සතර කරන්දෙණිය,අම්බලංගොඩ, හික්කඩුව,ඉමදූව,බෙන්තොට, බද්දේගම,අක්මීමන,වැලිවිටිය, දිවිතුර,ගෝනාපීනුවල* | *20* | *140* | *2,439,278.35* | *2,369,190.45* | *100* |
| *මාතලේ* | *අඹන්ගඟ කෝරලේ, මාතලේ, උකුවෙල,දඹුල්ල, යටවත්ත* | *18* | *89* | *1,219,639.18* | *1,200,789.45* | *100* |
| *බදුල්ල* | *පස්සර, බණ්ඩාරවෙල* | *2* | *30* | *387,833.45* | *361,425.41* | *99* |
| *මොණරාගල* | *මොණරාගල* | *1* | *15* | *102,061.86* | *99,821.40* | *99* |
| *කුරුණෑගල* | *උඩුබද්දාව, අලව්ව, කුරුණෑගල, කුලියාපිටිය බටහිර, ගනේවත්ත කොබෙයිගනේ,පොල්ගහවෙල, නාරම්මල,මල්ලවපිටිය, කොටවෙහෙර, මාවතගම, බමුණාකොටුව, පඬුවස්නුවර නැගෙනහිර* | *30* | *270* | *2,845,484.54* | *2,838,020.10* | *100* |
| *නුවරඑළිය* | *හඟුරන්කෙත* | *2* | *20* | *607,877.94* | *597,248.00* | *99* |
| *ගම්පහ* | *අත්තනගල්ල, මීනුවන්ගොඩ, මීරිගම* | *5* | *74* | *1,617,681.13* | *1,600,581.20* | *100* |
| *අම්පාර* | *කල්මුණේ,අම්පාර,කරේතිවු, නින්දවූර්* | *4* | *52* | *920,086.60* | *910,000.60* | *100* |
| *වවුනියාව* | *වෙන්ගලචෙට්ටිකුලම්* | *1* | *10* | *117,371.13* | *100,950.00* | *100* |
| *කිලිනොච්චි* | *පූනකරි,පච්චලිප්පලි* | *2* | *35* | *377,628.87* | *370,574.00* | *100* |
| *මඩකලපුව* | *එරාවූර් නගර,පෝරතිවුපත්තු, වෙල්ලවෙලි,මන්මුනෙයි නිරිත, කාත්තන්කුඩි, පෝතිවුපත්තු* | *7* | *135* | *1,367,628.87* | *1,364,741.12* | *100* |
| *යාපනය* | *නල්ලූර්,සන්දිලිප්පලි,තෙලිප්පලි* | *3* | *75* | *520,515.46* | *510,900.00* | *100* |
| *ත්‍රිකුණාමලය* | *තම්පලගමම්* | *1* | *30* | *173,505.15* | *169,505.10* | *100* |
| ***එකතුව*** | | | | ***24,748,995.5*** | ***24,232,781.73*** | |

### 10.1.3. මැටි භාණ්ඩ නිෂ්පාදන ගම්මාන සංවර්ධනය කිරීම

ග්‍රාමීය මැටි නිෂ්පාදන කර්මාන්ත ක්ෂේත්‍රයේ නිරත කාර්මිකයින් දිරිගැන්වීම, මැටි කර්මාන්තකරුවන් ආර්ථිකමය වශයෙන් ශක්තිමත් කිරීම, වෙළෙඳපොළ අරමුණු කර ගත් නිෂ්පාදන හඳුන්වාදීම තුළින් වෙළෙඳපොළ අවස්ථා වැඩිදියුණු කිරීම සහ අඩු ආදායම්ලාභී මැටි කර්මාන්තකරුවන් සඳහා උපකරණ ලබා දීම මෙම ව්‍යාපෘතිය මඟින් බලාපොරොත්තු වේ.

මෙම ව්‍යාපෘතිය සඳහා දේශීය අරමුදලින් රු.මි. 5ක ප්‍රතිපාදන සමාලෝචිත වර්ෂය සඳහා ලබා දී ඇත. කෑගල්ල, නුවරඑළිය, මාතලේ, මොණරාගල, පුත්තලම, කුරුණෑගල, හම්බන්තොට හා ගම්පහ යන දිස්ත්‍රික්කයන්හි ප්‍රාදේශීය ලේකම්වරුන් විසින් ඉදිරිපත් කරන ලද ව්‍යාපෘති යෝජනා අනුව මැටි ගම්මාන ශක්තිමත් කිරීම සඳහා ආයෝජනයන් සිදු කර ඇත. මෙම ව්‍යාපෘතිය යටතේ සිදුකළ ක්‍රියාකාරකම් පහත දැක්වේ.

- සාම්ප්‍රදායික මැටි වළං කර්මාන්තයේ නියැලි කර්මාන්තකරුවන් සඳහා පුහුණුව ලබා දීම
- මැටි කර්මාන්තකරුවන්ට නවීන තාක්ෂණය ලබාදීම සඳහා පුහුණු වැඩසටහන් පැවැත්වීම
- මැටි භාණ්ඩ නිෂ්පාදනය සඳහා මැටි අඹරන යන්ත්‍ර ලබා දීම
- මැටි කර්මාන්තකරුවන් සඳහා විදුලි සකපෝරු ලබාදීම
- මැටියෙන් තනන ලද ගෑස් වළං නිෂ්පාදනය කිරීම සඳහා අවශ්‍ය යන්ත්‍ර, උපකරණ හා අච්චු ලබා දීම

- ❖ මැටි වළං ආශ්‍රිත කර්මාන්තකරුවන් සඳහා වෙළෙඳපොළ සහය ලබා දීම සඳහා අලෙවි මධ්‍යස්ථාන හඳුන්වාදීම
- ❖ මැටි කර්මාන්තකරුවන් අලෙවි ප්‍රදර්ශන වෙත යොමුකිරීම තුළින් ඔවුන් දිරිගැන්වීම

2018 වසරේදී මැටි භාණ්ඩ නිෂ්පාදන ගම්මාන සංවර්ධන ව්‍යාපෘතිය සඳහා දේශීය අරමුදලින් රු. මි. 5ක ප්‍රතිපාදන ලබා දී ඇත. දිස්ත්‍රික්ක 08ක ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස 17ක ප්‍රතිලාභීන් 282 දෙනෙකු සඳහා සිදුකළ සංවර්ධන කටයුතු පහත දැක්වේ.

***මැටි භාණ්ඩ නිෂ්පාදන ගම්මාන සංවර්ධනය කිරීම***
***(ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස මට්ටමින්)***

| අනු අංකය | දිස්ත්‍රික්කය | ප්‍රා.ලේ. කොට්ඨාසය | ව්‍යාපෘති ක්‍රියාත්මක කරන ගම / ගම් | ප්‍රතිලාභීන් සංඛ්‍යාව | මුළු ප්‍රතිපාදන ප්‍රමාණය (රු.) | මූල්‍ය ප්‍රගතිය (රු.) | භෞතික ප්‍රගතිය (%) |
|---|---|---|---|---|---|---|---|
| 1 | කෑගල්ල | අරණායක | සාමගම,තෙල්එක | 30 | 418,453.61 | 410,000.00 | 100 |
| 2 | නුවරඑළිය | හඟුරන්කෙත | පුරාණගම | 7 | 150,030.93 | 149,985.00 | 100 |
| 3 | **මාතලේ** | රත්තොට | ඊ 371 බී උඩවේරගම | 2 | 81,649.48 | 80,920.61 | 100 |
| 4 | මොණරාගල | මැදගම | තිඹිරිය | 10 | 211,268.04 | 210,200.00 | 100 |
| 5 | පුත්තලම | කරුවලගස්වැව | සුදුවැල්ල | 6 | 129,618.56 | 126,218.20 | 100 |
| | | ආණමඩුව | කුමාරගම | 25 | 316,391.75 | 310,000.00 | 100 |
| 6 | කුරුණෑගල | වීරඹුගෙදර | සියඹලාවැහැර | 7 | 150,030.93 | 147,000.00 | 100 |
| | | කුලියාපිටිය (බටහිර) | දීගල්ල,උණලීය, වහුමුව | 18 | 418,453.61 | 409,900.20 | 100 |
| | | බමුණාකොටුව | පස්සැල්ලෑවැව | 25 | 418,453.61 | 399,315.00 | 100 |
| | | උඩුබද්දාව | සියඹලාගස්රුප්ප | 30 | 418,453.61 | 408,08200 | 100 |
| | | ඉබ්බාගමුව | 498 කහටවෙල,<br>488 නින්දපැල්ල | 11 | 418,453.61 | 408,689.00 | 100 |
| | | නිකවැරටිය | ඉහළ පත්කොළවැව | 21 | 418,453.61 | 409,900.36 | 100 |
| | | ගිරිබාව | වරාවැව, ඉහළවැව | 20 | 255,154.64 | 245,745.00 | 100 |
| 7 | හම්බන්තොට | වීරකැටිය | කැප්පිටියාව උතුර | 20 | 211,268.04 | 207,900.00 | 100 |
| | | වලස්මුල්ල | බිබුලගොඩ | 30 | 211,268.04 | 210,000.00 | 100 |
| 8 | ගම්පහ | දොම්පෙ | මල්වාන,කළුකොඳයාව නැගෙනහිර,<br>කළුකොඳයාව බටහිර | 10 | 316,391.75 | 281,00.00 | 100 |
| | | මහර | වරහන්තුඩුව | 10 | 406,206.19 | 399,110.00 | 100 |
| **එකතුව** | | | | **282** | **4,950,000.00** | **4,533,965.37** | |

## 10.2. ග්‍රාමීය යටිතල පහසුකම් හා ජීවනෝපාය සංවර්ධන වැඩසටහන - 2018

ග්‍රාමීය ජනතාව නගාසිටුවීම මෙන්ම නාගරික හා අර්ධ නාගරික කලාපවල අඩු ආදායම්ලාභී ජනතාවගේ ආදායම් මට්ටම ඉහළ නැංවීම සඳහා ඵලදායී ක්‍රියාමාර්ග ගැනීම මෙම වැඩසටහන තුළින් බලාපොරොත්තු වේ. සමාලෝචිත වර්ෂය තුළ මෙම වැඩසටහන ක්‍රියාත්මක කිරීම සඳහා දේශීය අරමුදලින් රු.මි. 400ක ප්‍රතිපාදන ලබා දී ඇත.

ප්‍රජා සහභාගීත්ව ක්‍රමවේදය අනුව ගමේ සංවර්ධනය කළ යුතු යටිතල පහසුකම් සංවර්ධනය කිරීම යටතේ ග්‍රාමීය ප්‍රවේශ මාර්ග සංවර්ධනය කිරීම, බෝක්කු, කුඩා පාළම්, කාණු පද්ධති ඉදිකිරීම් හා නවීකරණය කිරීම්, පොදු පානීය ජල සම්පාදනය, පානීය ළිං අළුත්වැඩියා කිරීම, බහු කාර්ය ගොඩනැගිලි හා වෙනත් පොදු ගොඩනැගිලි අළුත්වැඩියා කිරීම වැනි සංවර්ධන ක්‍රියාකාරකම් මේ යටතේ සිදු කෙරේ.

එසේම ග්‍රාමීය ජනතාවගේ ආර්ථිකය හා ජීවනෝපාය සංවර්ධනය කිරීම සඳහා අවශ්‍ය දැනුම, උපකරණ හා පහසුකම් ලබා දීම, ග්‍රාමීය ව්‍යවසායකත්වය සංවර්ධනය කිරීම සඳහා අවශ්‍ය දැනුම, උපකරණ, තාක්ෂණය හා පහසුකම් ලබා දීම ග්‍රාමීය සංවර්ධන ඉලක්ක ළඟා කරගැනීමෙහිලා අත්‍යාවශ්‍ය සාධක වේ. ඒතුළින් ආදායම් උත්පාදනය, ස්වයංරැකියා සඳහා ජනතාව යොමුකිරීම, ග්‍රාමීය නිෂ්පාදන ඉහළ නැංවීම සඳහා ලැබෙන සහය වැදගත්ය. මෙම අරමුණු ඉටුකරගැනීම සඳහා ග්‍රාම නිලධාරී වසම් මට්ටමින් හඳුනාගනු ලබන අඩු ආදායම් ලාභී ජනතාව සඳහා වගා කටයුතු සඳහා ජල මෝටර්, කෘෂිකාර්මික කටයුතු සඳහා තණකොළ කපන යන්ත්‍ර, මහන මැෂින්, ධීවර ආම්පන්න වැනි උපකරණ ලබා දීමට කටයුතු කර ඇත.

ගෘහ කර්මාන්ත වැඩිදියුණු කිරීම හා කුඩා ව්‍යවසාය සංවර්ධනය සඳහා අවශ්‍ය පුහුණුව ලබා දීම, තාක්ෂණය ලබා දීම හා උපකරණ ලබා දීම සඳහා ද මෙම ව්‍යාපෘතිය මගින් සහය ලබාදෙන ලදී. පශු සම්පත් සංවර්ධනය තුළින් ග්‍රාමීය ආර්ථිකය නැංවීමට ද මෙම ව්‍යාපෘතිය යටතේ අවධානය යොමුකර ඇති අතර ඒ අනුව කිරි ගවයින් හා කුකුළු පැටවුන් ලබා දීම, ගවගාල් ඉදිකිරීම සඳහා අවශ්‍ය සහාය ලබා දී ඇත.

මඩකලපුව, මාතලේ, මොණරාගල, කළුතර, ගාල්ල, පුත්තලම, රත්නපුර හා මුලතිව් යන දිස්ත්‍රික්ක තුළ මෙම ව්‍යාපෘතිය 2018 වර්ෂයේදී ක්‍රියාත්මක කරන ලදී. ප්‍රාදේශීය ලේකම්වරුන් හා දිස්ත්‍රික් ලේකම්වරුන් මගින් හඳුනාගනු ලබන යෝජනා සඳහා වෙන්කරනු ලබන ප්‍රතිපාදන දිස්ත්‍රික් ලේකම්වරු වෙත යොමු කර ඇත. ග්‍රාමීය දිළිඳුබව අවමකිරීම, ග්‍රාමීය ව්‍යවසායකයන් ශක්තිමත් කිරීම, ආදායම් උත්පාදනය, ස්වයංරැකියා සඳහා ජනතාව යොමුකිරීම මගින් ග්‍රාමීය ආර්ථිකය ශක්තිමත් කිරීම තුළින් යහපත් ආර්ථිකයක් හා ජීවන රටාවක් සම්පාදනය කිරීමට කටයුතු කර ඇත.

## 10.3. විශේෂිත ආර්ථික මධ්‍යස්ථාන

කෘෂි අලෙවි සංවර්ධන උපාය මාර්ගයක් ලෙස ග්‍රාමීය ප්‍රදේශවල නිෂ්පාදන අලෙවි කර ගැනීම සඳහා පහසුකම් සැපයීමේ අරමුණින් 1998 වසරේ සිට රජයේ අයවැය ප්‍රතිපාදන උපයෝගී කර ගනිමින් විශේෂිත ආර්ථික මධ්‍යස්ථාන පිහිටුවීම ආරම්භ කරන ලදී. එතෙක්, ග්‍රාමීය කර්මාන්ත හා ස්වයං රැකියා ප්‍රවර්ධන අමාත්‍යාංශය යටතේ පැවැති විශේෂිත ආර්ථික මධ්‍යස්ථාන විෂය පථය 2007 වර්ෂයේදී වෙළෙඳ, අලෙවි සංවර්ධන, සමුපකාර හා පාරිභෝගික සේවා අමාත්‍යාංශය යටතටද 2010 වර්ෂයේ සමුපකාර හා අභ්‍යන්තර වෙළෙඳ අමාත්‍යාංශය යටතටද 2015 වර්ෂයේ ජනවාරි මස සිට සැප්තැම්බර් දක්වා ආහාර සුරක්ෂිතතාව අමාත්‍යාංශය යටතේ ද ක්‍රියාත්මක වූ මෙම විශේෂිත ආර්ථික මධ්‍යස්ථාන ජාලය 2015 සැප්තැම්බර් මස 21 වන දින සිට ග්‍රාමීය ආර්ථිකය පිළිබඳ අමාත්‍යාංශය යටතට පත්වූ අතර, 2018 දෙසැම්බර් මස සිට මෙම අමාත්‍යාංශයේ විෂය පථයට ඇතුළත්ව ඇත.

සියලුම විශේෂිත ආර්ථික මධ්‍යස්ථාන සමඟ සම්බන්ධීකරණය හා මෙහෙයවීම් කටයුතු සංවර්ධන හා සැලසුම් අංශය මඟින් සිදු කෙරේ. දැනට ක්‍රියාත්මක මට්ටමේ පවතින ආර්ථික මධ්‍යස්ථාන සංඛ්‍යාව 15ක් වන අතර වව්නියාව හා මඩකලපුව විශේෂිත ආර්ථික මධ්‍යස්ථාන විවෘත කිරීමට නියමිතය.

විශේෂිත ආර්ථික මධ්‍යස්ථාන ප්‍රභේද තුනකි.

- ❖ කෘෂි නිෂ්පාදන ප්‍රදේශ කේන්ද්‍ර කරගත් තොග මධ්‍යස්ථාන
- ❖ කෘෂි නිෂ්පාදන හා අත්‍යාවශ්‍ය ආහාර ද්‍රව්‍ය තොග/සිල්ලර වශයෙන් බෙදාහැරීමේ මධ්‍යස්ථාන
- ❖ නාගරික ප්‍රදේශ කේන්ද්‍ර කරගත් සිල්ලර අලෙවි මධ්‍යස්ථාන

ආර්ථික මධ්‍යස්ථාන සියල්ලම අමාත්‍යාංශයේ සෘජු අධීක්ෂණය යටතේ එක් එක් ආර්ථික මධ්‍යස්ථාන සඳහා පිහිටුවා ඇති කළමනාකරණ භාර මණ්ඩලයක් මගින් ක්‍රියාත්මක වේ. කළමනාකරණ භාරයේ සභාපති ලෙස අදාළ දිස්ත්‍රික්කයේ දිස්ත්‍රික් ලේකම් ද, ලේකම් ලෙස අදාළ ප්රාදේශීය ලේකම් ද කටයුතු කරන අතර, වෙළෙඳ සංගමය හා ගොවි සංවිධාන නියෝජිතයන්ගෙන් සහ ආර්ථික මධ්‍යස්ථාන විෂය පථයට අදාළ වන රාජ්‍ය ආයතනවල නියෝජිතයන්ගෙන් මෙම කළමනාකරණ භාරය සමන්විත වේ. අමාත්‍යාංශයේ ලේකම් මෙම කළමනාකරණ භාරයන්හි ස්ථාපනකරු වන අතර, අමාත්‍යාංශයේ මාණ්ඩලික නිලධාරියෙකු කළමනාකරණ භාරයක සමාජිකත්වය දරයි. මෙම සියලුම කළමනාකරණ භාරයන් භාර ආඥා පනත යටතේ භාර ඔප්පු මඟින් ස්ථාපිත කර ඇත.

***විශේෂිත ආර්ථික මධ්‍යස්ථානවල පිහිටීම***

| පළාත | නිෂ්පාදන ප්‍රදේශ කේන්ද්‍ර කරගත් මධ්‍යස්ථාන | නිෂ්පාදන බෙදාහැරීමේ මධ්‍යස්ථාන (තොග/සිල්ලර) | නාගරික ප්‍රදේශ කේන්ද්‍ර කරගත් සිල්ලර බෙදාහැරීමේ මධ්‍යස්ථාන | විවෘත කිරීමට යෝජිත ආර්ථික මධ්‍යස්ථාන |
|---|---|---|---|---|
| **බස්නාහිර** | | වැලිසර<br>මීගොඩ<br>වේයන්ගොඩ<br>රත්මලාන | නාරාහේන්පිට<br>පිළියන්දල | |
| **මධ්‍යම** | නුවරඑළිය<br>දඹුල්ල<br>කුරුඳුවත්ත<br>කන්දෙහන්දිය | | | |
| **ඌව** | කැප්පෙටිපොල | | | |
| **උතුරු මැද** | තඹුත්තේගම | | | |
| **සබරගමුව** | ඇඹිලිපිටිය | | | |
| **නැගෙනහිර** | අම්පාර | | | මඩකලපුව |
| **උතුර** | කිලිනොච්චිය | | | වවුනියාව |

*විශේෂිත ආර්ථික මධ්‍යස්ථානයන්හි වෙළෙඳ පරිශ්‍රයන්*

| විශේෂිත ආර්ථික මධ්‍යස්ථානය | ආරම්භක දිනය | පරිශ්‍ර සංඛ්‍යාව | |
|---|---|---|---|
| | | කඩ කාමර | ගබඩා |
| දඹුල්ල | 1999.04.01 | 157 | |
| නුවරඑළිය | 2006.04.08 | 138 | |
| කැප්පෙටිපොල | 2001.08.12 | 71 | |
| තඹුත්තේගම | 2005.09.13 | 59 | |
| ඇඹිලිපිටිය | 2003.02.25 | 46 | |
| මීගොඩ | 2003.02.07 | 105 | |
| වැලිසර | 2003.10.07 | 133 | |
| වේයන්ගොඩ | 2007.08.16 | 71 | 06 |
| නාරාහේන්පිට | 2008.12.14 | 196 | 10 |
| රත්මලාන | 2009.03.28 | 128 | |
| පිළියන්දල | 2010.03.24 | 58 | |
| කන්දෙහන්දිය | 2006.01.27 | 25 | |
| කුරුඳුවත්ත | 2008.02.17 | 14 | |
| කිලිනොච්චිය | 2017.10.14 | 40 | |
| අම්පාර | 2017.12.02 | 24 | |
| වවුනියාව | විවෘත කිරීමට නියමිතය | 50 | |
| මඩකලපුව | | 50 | |

## 10.3.2. මෙම වසර තුළ ක්‍රියාත්මක කරන ලද වැඩසටහන් හා ව්‍යාපෘතීන්හි ප්‍රගතිය

### 10.3.2.1. විශේෂිත ආර්ථික මධ්‍යස්ථාන පිහිටුවීම

- **වවුනියාව විශේෂිත ආර්ථික මධ්‍යස්ථානය**

වවුනියාව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ මූන්රුමුරිප්පු ග්‍රාම නිලධාරි වසමේ ඉදිකරනු ලබන මෙම මධ්‍යස්ථානය ඉදිකිරීම සඳහා ඒකාබද්ධ අරමුදලින් රුපියල් මිලියන 200ක ප්‍රතිපාදන මේ සඳහා ලබා දී ඇත. මෙම මධ්‍යස්ථානය වර්ග අඩි 180 බැගින් වූ ව්‍යාපාර පරිශ්‍ර 50කින් සමන්විත වේ.

මෙම මධ්‍යස්ථානයේ ඉදිකිරීම් කටයුතු ඉංජිනේරුමය කාර්යයන් පිළිබඳ මධ්‍යම උපදේශක කාර්යාංශය විසින් සිදුකරන ලද අතර, මේ වන විට ඉදිකිරීම් අවසන් කර ඇති අතර ඉදිරියේදි විවෘත කිරිමට අපේක්ෂිතය.

- **මඩකලපුව විශේෂිත ආර්ථික මධ්‍යස්ථානය**

මඩකලපුව දිස්ත්‍රික්කයේ මන්මුනේ දකුණ එරුවිල්පත්තු ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ කලුතාවලෙයි ග්‍රාම නිලධාරී වසමේ ඉදිකරනු ලබන මෙම ආර්ථික මධ්‍යස්ථානය සඳහා ඇස්තමේන්තුගත පිරිවැය රුපියල් මිලියන 300කි. එය වර්ග අඩි 180 බැගින් වූ ව්‍යාපාර පරිශ්‍ර 50 කින් සමන්විතය. 2017 අයවැය යෝජනා මගින් මෙම මධ්‍යස්ථානයේ ඉදිකිරීම සඳහා රුපියල් මිලියන 300 ක ප්‍රතිපාදන ලැබූ අතර මෙහි ඉදිකිරීම් කටයුතු 2017.07.22 දින ආරම්භ කරන ලදුව ගොඩනැගිලි දෙපාර්තමේන්තුවේ අධීක්ෂණය යටතේ ඉංජිනේරුමය කාර්යයන් පිළිබඳ මධ්‍යම උපදේශක කාර්යාංශය විසින් සිදු කරන ලදී. ඉදිකිරීම් කටයුතු නිම කර ඇති මෙම මධ්‍යස්ථානය ඉදිරියේදි විවෘත කිරිමට නියමිතය.

### 10.3.3. විශේෂිත ආර්ථික මධ්‍යස්ථාන නවීකරණ කටයුතු

ආර්ථික මධ්‍යස්ථාන නවීකරණ කටයුතු සඳහා 2018 වසරේදී දේශීය අරමුදලින් රු.මි. 28.17ක ප්‍රතිපාදන ලබා දී ඇත. 2018.12.31 දිනට ප්‍රගතිය පහත පරිදිවේ.

| නවීකරණ කාර්යය | ප්‍රතිපාදන (රු.මි.) | භෞතික ප්‍රගතිය | මූල්‍ය ප්‍රගතිය (රු.මි.) |
|---|---|---|---|
| **මීගොඩ විශේෂිත ආර්ථික මධ්‍යස්ථානය** | | | |
| R පරිශ්‍රයේ වහලය ඉදිකිරීම | 13.574 | ඉදිකිරීම් කටයුතු අවසන් කර ඇත | 13.574 |
| **වැලිසර විශේෂිත ආර්ථික මධ්‍යස්ථානය** | | | |
| ගොඩනැගිලි අංක 01 සඳහා වහලය ඉදිකිරීම | 7.053 | ඉදිකිරීම් කටයුතු අවසන් කර ඇත | 5.679 |
| **ඇඹිලිපිටිය විශේෂිත ආර්ථික මධ්‍යස්ථානය** | | | |
| විවෘත ශාලාව සඳහා දැල් ආවරණය යෙදීම | .0.759 | ඉදිකිරීම් කටයුතු අවසන් කර ඇත | 0.946 |
| ආර්ථික මධ්‍යස්ථානය සඳහා ජල සැපයුම ලබා ගැනීම | 0.128 | ඉදිකිරීම් කටයුතු අවසන් කර ඇත | |
| ආර්ථික මධ්‍යස්ථානය සඳහා ශබ්ද විකාශන යන්ත්‍රයක් ස්ථාපිත කිරීම | 0.152 | ඉදිකිරීම් කටයුතු අවසන් කර ඇත | |

### 10.3.4. විශේෂිත ආර්ථික මධ්‍යස්ථානවල අභිවෘද්ධිය සඳහා 2018 වර්ෂයේ සිදුකළ කාර්යයන්

❖ **විශේෂිත ආර්ථික මධ්‍යස්ථානවල භාර අරමුදල්වලින් සංවර්ධන කටයුතු සිදුකිරීම**

| ආර්ථික මධ්‍යස්ථානය | සංවර්ධන කටයුතු | ඇස්තමේන්තුගත මුදල (රු.) | භෞතික ප්‍රගතිය (%) | මූල්‍ය ප්‍රගතිය (%) |
|---|---|---|---|---|
| **තඹුත්තේගම** | රථගාල නවීකරණය කිරීම | 787,420.09 | 100 | 100 |
| | හිස් බිම් තීරු සඳහා අන්තර් සම්බන්ධිත ගල් ඇතිරීම | 698,782.12 | 100 | 100 |
| | අපද්‍රව්‍ය බැහැර කරන ඔරුලගයාය ඉඩම වටා ආරක්ෂිත කම්බි වැටක් ඉදිකිරීම හා ගේට්ටුවක් සකස් කිරීම | 979,972.93 | 100 | 100 |
| | පදික වේදිකා සඳහා ආරක්ෂිත වැටක් ඉදි කිරීම | 1,389,954.93 | 100 | 100 |
| | පිටුපස ගේට්ටුව සකස් කිරීම | 217,478.36 | 100 | 100 |
| | පාපැදි, යතුරු පැදි රථගාල සහ ගොඩනැගිලි අසල අන්තර් සම්බන්ධිත ගල් ඇතිරීම | 399,623.41 | 100 | 100 |
| | පසුපස කාණු පද්ධතිය සකස් කිරීම | 878,547.74 | 100 | 100 |
| | කාර්යාලය නවීකරණය | 61,248.96 | 100 | 100 |
| | විවේකාගාරය නිවාඩු නිකේතනයක් ලෙස නවීකරණය කිරීම | 826,435.40 | 100 | 100 |
| | රැස්වීම් ශාලාව අලුත්වැඩියා කිරීම | 1,253,706.71 | 100 | 100 |
| | නව ආපනශාලාව නවීකරණය කිරීම | 623,432.83 | 100 | 90 |
| | මධ්‍යස්ථානයේ දකුණුපස කාණු පද්ධතිය සකස් කිරීම | 1,914,124.68 | 100 | 90 |
| | ගබඩා කාමරයක් ඉදිකිරීම | 925,252.14 | 100 | 100 |

| ආර්ථික මධ්‍යස්ථානය | සංවර්ධන කටයුතු | ඇස්තමේන්තුගත මුදල (රු.) | භෞතික ප්‍රගතිය (%) | මූල්‍ය ප්‍රගතිය (%) |
|---|---|---|---|---|
| | පිටුපස ගේට්ටුව සඳහා බෝක්කුව ඉදිකිරීම | 331,328.82 | 100 | 100 |
| | අභ්‍යන්තර මාර්ග පද්ධතියේ කොටසක් බෙදා වෙන් කිරීම | 1,287,000.00 | 100 | 90 |
| කැප්පෙටිපොල | රථගාලට ආසන්න බිම් තීරුව තාර යෙදීම | 7,685,587.94 | 100 | 100 |
| | රැස්වීම් ශාලාව සඳහා වැසිකිළි පද්ධතියක් ඉදිකිරීම | 789,708.05 | 100 | 100 |
| | CCTV කැමරා පද්ධතියක් ස්ථාපිත කිරීම | 2,190,000.00 | 100 | 100 |
| නාරාහේන්පිට | සමනල උයන පැත්තේ ඇති ආරක්ෂක බැම්ම සෑදීම | 726,766.65 | 100 | 100 |
| | රෙදිපිළි සංකීර්ණයේ සිවිලිම සකස් කිරීම | 2,828,147.33 | 100 | 100 |
| | එළවළු පරිශ්‍රයේ විදුලි පංකා සවි කිරීම | 2,235,524.56 | 100 | 100 |
| | H කඩ පේළිය අලුත්වැඩියා කිරීම | 1,033,978.49 | 100 | 100 |
| | R කඩ පේළිය අලුත්වැඩියා කිරීම | 1,267,060.87 | 100 | 100 |
| රත්මලාන | කසල එක් රැස් කිරීමේ ටැංකිය ස්ථාපනය කිරීම | 265,345.11 | 100 | 100 |
| | ඉදිරිපස තාප්පය අලුත්වැඩියා කිරීම | 181,304.10 | 100 | 100 |
| දඹුල්ල | ආපනශාලා ඉදිරිපස හා පිටුපස ගිලා බැස ඇති භූමි කොටස් සකස් කිරීම හා කාණු පද්ධතිවල අබලන් වී ඇති කොන්ක්‍රීට් කැබලි වෙනුවට නව කොන්ක්‍රීට් ආවරණ යෙදීම | 1,135,929.00 | 10 | - |
| | රථගාල හා උද්‍යාන කොටස්වල විදුලි පද්ධතීන් සකස් කිරීම. | 759,000.00 | 10 | - |
| | ගෘහස්ථ වහලයේ විදුලි පද්ධතීන් සකස් කිරීම | 5,473,500.00 | 10 | - |
| | වැසිකිළි අපහරණ පද්ධතිය සඳහා නව මෝටර් ලබා ගැනීම | 3,633,020.00 | 10 | - |
| පිළියන්දල | ෆයිබර් ග්ලාස් විදුලි මීටර් ආවරන පෙට්ටිය සැකසීම | 334,310.00 | 100 | 100 |
| නුවරඑළිය | අභ්‍යන්තර මාර්ග කාපට් කිරීම | 5,188,072.25 | 10 | - |
| | කාර්යාල උපකරණ මිලදී ගැනීම | 255,150 | 100 | 100 |
| | පරිගණක මෘදුකාංගයක් සකස් කර ගැනීම | 350,000.00 | 50 | - |
| | නේවාසිකාගාරය නවීකරණය කිරීම | 600,000.00 | 100 | 25 |
| | පොදු විදුලි පද්ධතිය සඳහා විදුලි ජනකයක් මිලදී ගැනීම | 2,000,000.00 | 5 | - |
| | ජල පොම්පාගාරය සඳහා සංවේදක උපාංග සවි කිරීම | 148,750.00 | 100 | 100 |
| වැලිසර | 1 සහ 2 ගොඩනැගිලි අතර සපත්තු කාණුවක් සකස් කිරීම | 588,055.33 | 100 | 100 |
| | කසල අංගනය පුළුල් කිරීම | 545,047.27 | 100 | 100 |
| | මායිම් බැම්මක් ඉදිකිරීම | 429,420.48 | 100 | 100 |
| ඇඹිලිපිටිය | මධ්‍යස්ථානයේ ප්‍රධාන ගේට්ටු දෙක අලුත්වැඩියා කිරීම | 138,240.00 | 100 | 100 |

### 10.3.5. විශේෂිත ආර්ථික මධ්‍යස්ථානයන්හි මූල්‍ය ප්‍රගතිය

| ආර්ථික මධ්‍යස්ථානය | මුළු ආදායම (රු.මි.) | මුළු වියදම (රු.මි.) |
|---|---|---|
| *දඹුල්ල* | *64.07* | *53.53* |
| *කැප්පෙටිපොල* | *25.84* | *14.87* |
| *මීගොඩ* | *10.51* | *10.82* |
| *ඇඹිලිපිටිය* | *3.39* | *3.16* |
| *වැලිසර* | *16.83* | *12.16* |
| *තඹුත්තේගම* | *28.89* | *11.58* |
| *කන්දෙහන්දිය* | *0.008* | *0.12* |
| *නුවරඑළිය* | *13.50* | *8.51* |
| *වේයන්ගොඩ* | *8.46* | *6.89* |
| *කුරුඳුවත්ත* | *1.30* | *0.85* |
| *නාරාහේන්පිට* | *59.98* | *44.94* |
| *රත්මලාන* | *16.5* | *9.2* |
| *පිලියන්දල* | *2.56* | *4.57* |
| *අම්පාර* | *0.15* | *0.07* |
| *කිලිනොච්චි* | *0.39* | *0.43* |